# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 68 — 1973 ජුලි 13 වැනි සිකුරාදා — 1973.07.13

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (II අ) වැනි ඡේදය — පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු — ඇබෑර්තු ... ... | 851 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 864 |

සැළකිය යුතුයි.—(i) බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත 1973 ජූනි 29 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී, පනත 1973 ජුලි 13 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ (ii) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 21 දරන මුද්දර (සංශෝධන) II කොටසේ අතිරේකයක් වශයෙන් පළවේ. (iii) මෙවර ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් පත්‍රයේ VI වැනි කොටසේ ජූරි සභිකයන්ගේ හා උපදේශකවරුන්ගේ නාම ලේඛනයක්ද පළ වේ.

# තනතුරු — ඇබෑර්තු

### ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ශෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අනාකාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහය රෙගුලාසි. දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

**3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත්කිරීම් වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5 ක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5 ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½ කට සමාන මුදලක් අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටමත් රාජ්‍ය සේවා වෙහි සිටින්නන් හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යන්න පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියමකොට ඇත්නම් මිස, අදාළවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

(ii) සියළුම නව ප්‍රවේශක නිලධාරීන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියළුම නීතිරීති හා ව්‍යවස්ථාවල මතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් අනුකූලව ක්‍රියා කළ යුතුය යන කොන්දේසිය පිළිගත යුතුය.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දවල් 12 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් බාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. සී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

---

සංලක්ෂ්‍යය :

(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතු ය.

(ii) ඉල්ලු අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සළකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ හෝ සංයුක්ත මණ්ඩලවල සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු හෝ සංයුක්ත මණ්ඩලවල ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය. එසේකුදු වුවත් තම ඉල්ලුම් පත්‍ර එසේ එවූවේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්ට දැනගන්ට ලැබෙන සේ ඔහු වෙත කෙළින්ම ලියා එවිය යුතු ය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් නැනට හැර මෙම අමාත්‍යාංශයේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතු ය.

8. මෙම ගැසට් පත්‍රයේ පළමුවෙනි කොටසේ (IIඅ) ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි වලට අවධානය යොමු කරවනු ලැබේ.

නිහාල් ජයවික්‍රම,
ලේකම්,
අධිකරණ අමාත්‍යාංශය.

1973 ජූලි මස 02 දින,
කොළඹ 12,
අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

7-433 —73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

## වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ප්‍රචාරක නිලධාරී තනතුර

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ප්‍රචාරක නිලධාරී තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙහි පහත සඳහන් කර ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරගනු ලබන අයදුම්පත් 1973 අගෝස්තු මස 10 දින හෝ එදිනට කලින් කොළඹ 1, තැ.පෙ. 1652, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් නමට එවිය යුතුය.

සටහන.—(1) ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(2) අයදුම්පත් හෝ ඒවාට සම්බන්ධ ලිපි තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ කෙරෙන කිසියම් පැමිණිල්ලක් ගැන සලකා බැලිය නොහැක. අවසාන දින කීපය දක්වා අයදුම්පත් එවීම ප්‍රමාද කිරීම නිසා සිදුවිය හැකි අලාභහානි එම අපේක්ෂකයන් විසින්ම දරාගත යුතුය.

2. සේවයෙහි නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.—(1) මෙම තනතුර ස්ථිර හා අර්ථ-සාධක අරමුදල් පදනමක් මත වනු ඇත. ඒකාබද්ධ වැටුපෙන් 6% ක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට ගෙවීමට සිදුවන අතර, මේ සඳහා රජයේ දායක මුදල ඒකාබද්ධ වැටුපෙන් 9% ක් වනු ඇත.

(2) තෝරා ගනු ලබන අපේක්ෂකයා 1972 ජනවාරි 1 වන දිනට රජයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන්නේ නම් ඔහුගේ විශ්‍රාම වැටුප් හිමිකම් තවදුරටත් ආරක්ෂා කරනු ලැබේ.

3. වැටුප් හා දීමනා.—මෙම තනතුරට හිමි ඒකාබද්ධ වාර්ෂික වැටුප් පරිමාණය මෙසේ ය : රු. 4,152—144 × 7 හා 180 × 4—රු. 7,320 (රු. 5,304 ට පෙර කාර්යක්ෂමතා කඩඉම).

සටහන.—විශේෂ සුදුසුකම් හා පළපුරුදු ඇති අයදුම්කරුවෙකු තෝරා ගනු ලැබුවහොත්, ආයතන අධ්‍යක්ෂගේ අනුමැතිය ඇතිව, එම විශේෂ සුදුසුකම් හා පළපුරුදු අනුව, ඔහු වැටුප් පරිමාණයේ කිසියම් ලක්ෂයක තබනු ලැබේ. දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවෙකු තෝරා ගනු ලැබුව හොත් ඔහුගේ වැටුප තීරණය කරනු ලබන්නේ රජයේ ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 9 වැනි වගන්තිය අනුවය.

4. අවශ්‍ය සුදුසුකම්.—සෑම අපේක්ෂකයෙක්ම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) (i) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) හෝ ඊට සමාන සහතිකයක්;

(ii) පුවත්පත් කලාව පිළිබඳ පළපුරුද්ද විශේෂ සුදුසුකමක් වනු ඇත;

හෝ

(ආ) (i) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ ඊට සමාන සහතිකයක්;

(ii) පුවත්පත් කලාව පිළිබඳ අවුරුදු පහක පළපුරුද්ද;

(ඇ) ප්‍රසිද්ධ කිරීම සඳහා ඉංග්‍රීසියෙන් සහ සිංහලෙන් හෝ දෙමළෙන් හෝ ලිපි ප්‍රබන්ධ කිරීමට, සංස්කරණය කිරීමට සහ සකස් කිරීමට ඇති දක්ෂතාවය;

(ඈ) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අයදුම්කරුවන් අවුරුදු 25 ට නො අඩු හා අවුරුදු 40 ට නොවැඩි විය යුතුය. (රජයේ සේවයේ තනතුරු දරන්නන්ට මෙම වයස් සීමාවන් බළ නොපැවැත්වේ.)

(ඉ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත වීම.

5. පහත සඳහන් ලියවිලිවලින් කීපයක් හෝ සියල්ලම ඉල්ලා සිටි විට අපේක්ෂකයන් විසින් ඉදිරිපත් කළ යුතුය :—

(අ) උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සහතිකය. සැලකිය යුතුයි.—බෞතීස්ම සහතිකය හෝ අධ්‍යාපන රෙගුලාසි පරිදි ආධාර ලබන පාඨශාලාවන්හි ප්‍රයෝජනය සඳහා නිකුත් කරන ලද උප්පැන්න සහතිකය හෝ භාර ගනු නො ලැබේ;

(ආ) උසස්ම අධ්‍යාපන සහතිකය;

(ඇ) චරිත සහතික දෙකක්;

(ඈ) පුවත්පත් කලාව හා ලේඛන කලාවන් වල පළපුරුද්ද පිළිබඳ විස්තර.

සටහන.—(1) අයදුම්පත් වලට කිසිම ලියවිල්ලක් හෝ පිටපතක් නො ඇමිණිය යුතුය.

(2) ඉල්ලූ අවස්ථාවක දී ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

6. රජයේ සේවයේ හෝ සංයුක්ත මණ්ඩලවල සේවයේ නියුක්ත වූවන් තමන්ගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු/සංයුක්ත මණ්ඩල ප්‍රධානියා මගින් එවිය යුතුය.

7. ඉල්ලුම්පත්‍ර හා ඒ හා සම්බන්ධ අනෙකුත් ඕනෑම ලියවිල්ලක් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් වෙත මිස, මෙම අමාත්‍යාංශයේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

8. ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයෙහි සඳහන් රාජ්‍ය සේවයේ තනතුරු සඳහා කෙරෙන පත්වීම් සම්බන්ධයෙන් බලපාන පොදු කොන්දේසි වලට අවධානය යොමු කරනු ලැබේ.

ඩොරික් ද සූසා,
ලේකම්,
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය.

1973 ජූලි මස 03 වැනි දින,
අංක 6, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත,
තැ.පෙ. 1652,
කොළඹ 1.

### ආදර්ශ අයදුම් පත්‍රය

### වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ප්‍රචාරක නිලධාරි තනතුර සඳහා අයදුම් පත්‍රය

(අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නො ඇමිණිය යුතුය.)

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

2. තැපැල් ලිපිනය (ලිපිනයෙහි වෙනසක් වුවහොත් එය වහා දනුම් දිය යුතුය) :————.

3. (අ) උපන් දිනය :—

වර්ෂය :————, මාසය :————, දිනය :————.

(ආ) ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනය වන විට නියම වයස :——

වර්ෂය :————, මාසය :————, දිනය :————.

4. ඔබ ලංකා රට වැසියෙක් ද පාරම්පරික රට වැසියෙක් ද එසේ නැත්නම් ලියාපදිංචි වූ රටවැසියෙක් ද යන බව සඳහන් කරන්න (ලියාපදිංචි වූ රටවැසියෙක් නම් සම්පූර්ණ විස්තර සඳහන් කරන්න.) :————.

5. උපන් ස්ථානය :—

(අ) ඉල්ලුම්කරුගේ :————.
(ආ) පියාගේ :————.
(ඇ) පිය පාර්ශවයේ මුත්තාගේ :————.
(ඈ) පිය පාර්ශවයේ මී මුත්තාගේ :————.

6. (අ) ස්ත්‍රී පුරුෂ භාවය :————.
(ආ) ඔබ විවාහකද, අවිවාහකද, වැන්දඹුවක් ද යන බව :————.

7. සාමාර්ථය ලබා ඇති ඉහලම විභාගය :—

(1) සිංහල :————.
(2) දෙමළ :————.
(3) ඉංග්‍රීසි :————.

8 වයස අවුරුදු 12 න් පසුව ඉගෙනීම ලැබූ පාඨශාලා, විද්‍යාල හා වෙනත් ආයතන :—

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තීය අධ්‍යාපනය | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | ආයතනය | සිට | දක්වා |
| 1. ................ | ........ | ........ | 1. ................ | ........ | ........ |
| 2. ................ | ........ | ........ | 2. ................ | ........ | ........ |

9. ඔබ ණයගැති භාවයෙන් මිදී සිටින්නේ ද? ණය ගැතිව සිටින්නේ නම්, ඒ කොපමණ ද :————.

10. ඔබ සාපරාධී වරදකට උසාවියකදී චෝදනා ලැබූවෙක් ද? එසේ නම් දිනයන් සහ නඩු අංකය සමග සම්පූර්ණ විස්තර සඳහන් කරන්න. :————.

11. අධ්‍යාපන, වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් (ලබාගන්නා ලද සියලුම උපාධි, විශිෂ්ඨ සාමාර්ථ, වෘත්තීය හා කාර්මික සුදුසුකම්වල විස්තර, ඒවායේ දින, පන්තියන් වේ නම් එය, ඒවා සඳහා ගන්නා ලද විෂයයන් සහ ඒවා ලබාගත් ආයතන සඳහන් කරන්න.) :————

12. පුවත්පත් හා ලේඛන කලාව සහ ප්‍රචාරක කටයුතු පිළිබඳ පළපුරුද්ද :————.

13. දැනට නිරත රක්ෂාව හා ඊට ප්‍රථම කරන ලද රක්ෂාවන් (රක්ෂාවට බැඳුන දිනය, ඉන් අස්වූ දිනය හා අන්තිමට ලැබූ වාර්ෂික වේතනය සඳහන් කරන්න.) :—

| පදවිය | සිට | දක්වා | වාර්ෂික වැටුප රුපියල් |
|---|---|---|---|
| 1. ................................ | ........ | ........ | .................... |
| 2. ................................ | ........ | ........ | .................... |

**සැළකිය යුතුයි.**—ආණ්ඩුව යටතේ කළ සේවය අවසන් වීමට හේතුව මෙහි 13 වැනි කොටුවේ සඳහන් කළ යුතුයි.

14. තවත් තොරතුරු කිසිවක් වේ නම් ඒවා :————.

15. ඔබ ගැන තොරතුරු විමසිය යුතු ඔබ හොඳට දන්නා හඳුනන පුද්ගලයන් දෙදෙනෙකු ගේ නම සහ ලිපිනයන් ඉදිරිපත් කරන්න :—

(1) :————.
(2) :————.

මෙම ඉල්ලුම් පත්‍රයෙහි මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගත හොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව ඒ බව දැනගතහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් බවත් මම දැන සිටිමි.

දිනය :————. ඉල්ලුම්කරුගේ අත්සන.

7–417—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

## ධීවර දෙපාර්තමේන්තුවේ පර්යේෂණ නිලධාරි තනතුර

(ධීවර යාත්‍රා කාර්මික විද්‍යාව)

ධීවර දෙපාර්තමේන්තුවේ පර්යේෂණ නිලධාරි (ධීවර යාත්‍රා කාර්මික විද්‍යාව) තනතුරු 1 ක් සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයන් අනුව, පිළියෙල කළ ඉල්ලුම් පත්‍ර පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 3, ගාළු මුවදොර, තැ. පෙ. 1707, ධීවර අමාත්‍යාංශයේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය :—

**(ඒ)** මෙරට ඉල්ලුම් පත්‍ර—73.08.17
**(බී)** විදේශීය ඉල්ලුම් පත්‍ර—73. 08. 17

**සටහන් :**

(i) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(ii) පිටරටවල අයදුම්කරුවන් තම ඉල්ලුම් පත්‍ර ධීවර අමාත්‍යාංශයේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත් කොට සිටින ශ්‍රී ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළත දී භාර දීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iii) **වෛද්‍ය පරීක්ෂණ හා නැව් ගාස්තු.**—ශ්‍රී ලංකා ජනරජය යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍ය වරයෙකු ඉදිරියේ පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත්, ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත්, ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

**2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය. තුන් අවුරුදු ආධුනික කාලය කට යටත්ව පත්වීම කරනු ලැබේ. අයදුම්කරුවෙකු තෝරා ගනු ලැබුවහොත්, ඔහු රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරණ නිල ධාරියෙකු තෝරා ගනු ලැබුවහොත්, ඔහු අළුත් තනතුරෙහි ද විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ලැබීමට තවදුරටත් හිමිකම් ලබනු ඇත. පළමු කොට ඔහු නියමිත කාලසීමාවකට වැඩ බැලීමේ තනතුරකට පත් කරනු ලබන අතර, එම තනතුර දැරීමට ඔහු නුසුදුසු යයි සලකනු ලැබුව හොත්, එම කාලය තුළදී ඕනෑම අවස්ථාවක ඔහු මුල් තනතුරට ආපසු පත් කරනු ලැබේ.

(ii) පහත 3 වැනි ඡේදයෙහි දක්වා ඇති සුදුසුකම් ලබා ගැනීම සඳහා මෙම නිලධාරී නැන බඳවා ගත් පසු පිටරට යවනු ලැබේ.

(iii) පිටරට පුහුණු කරවීම පිණිස මේ නිලධාරියා තෝරා ගනු ලැබුවහොත්, එවිට පහත සඳහන් දේ පිළිබඳව ඔහු ශ්‍රී ලංකා ජන රජය සමග ගිවිසුමකට ඇතුළත් විය යුතුය.

(අ) අනිකුත් දේ අතර, නියමිත පුහුණුවීමේ පාඨමාලාවක් විශ්වාසදායක ලෙස හා උද්යෝගිමත් ලෙස හැදෑරීමටත්, එය සතුටු දායක ලෙස නිම කිරීමටත්, පුහුණුව නිම කිරීමෙන් පසු අවශ්‍ය වුවහොත් නියමිත කාලසීමාවකට (ජනරජය විසින් නියම කළ යුතුවූ) ශ්‍රී ලංකා ජනරජයට සේවය කිරීමටත් භාර ගැනීම, හා

(ආ) ගිවිසුමේ වගන්ති හා කොන්දේසි අනුව, කටයුතු නොකළ හොත් (වැටුප් දීමනා ගමන් වියදම් ගාස්තු ආදී) සම්පූර්ණ පුහුණුව සඳහා ශ්‍රී ලංකා ජනරජය හා/හෝ අනිකුත් ප්‍රදානය කිරීමේ ආයතන යන් මගින් දරණ ලද පුහුණුවීමේ මුළු වියදම ආපසු ශ්‍රී ලංකා ජන රජයට ගෙවීමට භාර ගැනීම.

**3. වැටුප් හා දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේ ය :—

රු. 7,440 ඒකාබද්ධ වැටුපකින් පටන් ගෙන, රු. 360 බැගින් වාර්ෂික වැටුප් වැඩිවීම් 10 කින් හා රු. 480 බැගින් වාර්ෂික වැටුප් වැඩිවීම් 11 කින් රු. 16,320 දක්වා නගින වාර්ෂික වැටුපකි. රු. 12,000 ට හා රු. 14,880 ට පෙර කාර්යක්ෂමතා කඩයිම් වේ. තෝරාගනු ලබන අයදුම්කරු විසින් ධීවර කර්මාන්තය, යාත්‍රා ශිල්පය, සමුද්‍ර ඉංජිනේරු විද්‍යාව හා ඉලෙක්ට්‍රෝනික විද්‍යාව පිළිබඳ නිව්ෆවුන්ඩ්ලන්තයේ ශාන්ත ජෝන් විද්‍යාලය මගින් ප්‍රදානය කරනු ලබන නාවික නිර්මාණ ශිල්පීය කාර්මික විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා සහතිකය හෝ ධීවර අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරනු ලබන ඒ හා සමාන සුදුසුකම් හෝ, ලබා නොගතහොත් රු. 11,520 වාර්ෂික වැටුප් ඉක්මවා යාමට සුදුසුකම් නො ලබනු ඇත.

**සටහන.**—(i) සේවයට බඳවා ගන්නා අවස්ථාවේදී මූලික විද්‍යා උපාධියකට වඩා උසස් වූ පී.එච්.ඩී. හෝ ඇම්. ඇස්. සී. වැනි උපාධියක් ඇති නිලධාරියෙකුට ගෙවනු ලබන, ආරම්භක වාර්ෂික වැටුප රු. 8,520 ක් වනු ඇත.

(ii) තෝරාගනු ලැබූ අයදුම්කරුගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව, ඔහුට වැටුප් පිළිබඳ අනුග්‍රහයක් දිය යුතුවේ නම්, ආයතන අධ්‍යක්ෂ ගෙන් විමසීමෙන් පසු ඔහු වැටුප් ක්‍රමයේ සුදුසු පියවරක තබනු ඇත.

**4. සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකු පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයක් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව,

(ආ) 73. 8. 17 දිනට වයස අවුරුදු 21 නොඅඩු සහ අවුරුදු 35 නොවැඩි බව,

(ඇ) ගණිතය අතිරේකව ඇතිව, භෞතික විද්‍යාව පිළිබඳව විශේෂඥ දැනුමක් ලබා ඇති, පිළිගත් විශ්ව විද්‍යාලයක පළමුවැනි හෝ දෙවැනි පන්තියේ ගෞරව උපාධිධරයෙකු බව.

5. පහත සඳහන් ලියකියවිලි වලින් එකක් හෝ සියල්ලම හෝ අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතිස්ම සහතික භාර ගනු නොලැබේ.)

(ආ) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතික.

(ඇ) චරිත සහතික දෙකක් (මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්ය වරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය.)

(ඈ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඉ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු. (i) අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයන්ගේ අයදුම් පත් ගැන සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වවුත් තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ ධීවර අමාත්‍යාංශයේ ලේකම්ට දැන ගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම එවිය යුතුය.

7. අයදුම් පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම ධීවර අමාත්‍යාංශයේ ලේකම් තැනට හැර, මෙම අමාත්‍යාංශයේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය .

8. මෙම ගැසට් පත්‍රයේ I වෙනි කොටසේ (IIඅ) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරු වලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි වලට අවධානය යොමු කරනු ලැබේ.

9. අපේක්ෂකයන්ගේ අයදුම් පත් භාර ගන්නා අවසාන දින සිට සති තුනක් ඇතුළත එම අයදුම් පත ලැබුණු බව දන්වනු ලැබේ. එසේ දැන්වීමක් නො ලැබුණු විට ඒ බව වහාම කොළඹ 3, ගාළු මුවදොර, තැ. පෙ. 1707, ධීවර අමාත්‍යාංශයේ ලේකම් වෙත දැනුම් දිය යුතුයි.

ධීවර අමාත්‍යාංශයේ ලේකම්.

1973 ජූලි 4 වෙනි දින,
කොළඹ 3, ගාළු මුවදොර,
තැ .පෙ. 1707,
ධීවර අමාත්‍යාංශයේ දී ය.

**ධීවර දෙපාර්තමේන්තුවේ පර්යේෂණ නිලධාරී (ධීවර යාත්‍රා කාර්මික විද්‍යාව) තනතුර සඳහා ආදර්ශ ඉල්ලුම් පත්‍රය**

(සැ. යු.—ඉල්ලුම් පත්‍ර බහාලන ලියුම් කවරයේ වම්පස, මුදුන් කෙළවරේ "ධීවර දෙපාර්තමේන්තුවේ පර්යේෂණ නිලධාරී (ධීවර යාත්‍රා කාර්මික විද්‍යාව) තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය" යන පාඨය ලියා එය ලියාපදිංචි තැපැලෙන්, කොළඹ 3, තැ. පෙ. අංක 1707, ධීවර අමාත්‍යාංශයේ ලේකම් වෙත එවිය යුතුය.)

1. සම්පූර්ණ නම :————.

2. ලිපිනය :————.

3. උපන් දිනය හා ස්ථානය :————.
1973. 8. 17 දිනට වයස, අවුරුදු :——, මාස :——, දින :——.

4. ජාතිය :————.

5. විවාහකද, අවිවාහකද යන බව :————.

6. අධ්‍යාපනික සුදුසුකම් :————.

7. වෘත්තීය සුදුසුකම් :————.

8. පාසැලෙන් අස්වූ පසු කළ රැකියා සහ/හෝ හැදෑරූ අභ්‍යාස පිළිබඳ විස්තර :————.
(සේවය භාර ගැනිමේ සහ අස්වීමේ දින සහ අස්වීමට හේතු සඳහන් කළ යුතුය)

9. දැනට කරන රක්ෂාව :————.

10. චරිත සහතික දී ඇති පුද්ගලයින්ගේ නම් :————.

11. වෙනත් සුදුසුකම් :————.

ම විසින් මෙම අයදුම් පතෙහි සපයා ඇති විස්තර සත්‍ය බවද, නිවැරදි බවද, මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් යම්කිසි විස්තරයක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ තෝරා ගැනීමට පෙර දැන ගැනීමට ලැබුණහොත්, ඒ හේතුවෙන් මා මෙම තනතුරට නුසුදුසු වීමටද, මේ තනතුරට මා පත්කර ගැනීමෙන් පසුව, එම වරද දැන ගන්නට ලැබුණහොත්, කිසිම වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමට, බැඳී ඇති බවද මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

7-412—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

**වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පාංශු ප්‍රස්ථාරක තනතුර**

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පාංශු ප්‍රස්ථාරක තනතුර සඳහා මෙයින් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. ඉල්ලුම් පත්‍ර පහත දක්වා ඇති ආකෘතියට අනුව පිළියෙල කොට 1973. 07. 31 දින හෝ ඊට පෙර "කොළඹ, තැ. පෙ. 1138, වාරිමාර්ග අධ්‍යක්ෂ" යන ලිපිනයට ලැබෙනසේ එවිය යුතුය.

2. **වැටුප් පරිමාණය.**—මෙම තනතුරට හිමි වාර්ෂික ඒකාබද්ධ වැටුප් පරිමාණය රු. 3,432—144×21—රු. 6,456 කි. රු. 5,304 වාර්ෂික වැටුප් ලක්ෂයට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ඇත්තේ ය.

3. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. පත්වීම කරනු ලබන්නේ අර්ථසාධක අරමුදල් ගෙවීමේ පදනම මතය. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට සේවකයා ඔහුගේ ඒකාබද්ධ වැටුපෙන් සීයයට 6 ක දායක මුදල් ගෙවිය යුතු අතර, රජයේ දායක මුදල ඒකාබද්ධ වැටුපෙන් සියයට 9 ක් වනු ඇත.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක්ම තමා—

(i) ලාංකිකයෙකු බවත් (පරම්පරාවෙන් පැවත එන හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ පුරවැසියා ලාංකිකයෙකි.)

(ii) 1973. 07. 31 දිනදී වයස අවුරුදු 20 ට නො අඩු සහ අවුරුදු 30 ට නොවැඩි බවත් (නියමිත අන් සියළු සුදුසුකම් ඇත්නම් දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින අපේක්ෂකයින් කෙරෙහි මෙම වයස් සීමාව බලපානු නොලැබේ.)

(iii) විශිෂ්ඨ චරිතයකින් හා යහපත් සෞඛ්‍යයෙන් යුක්ත බවත්,

(iv) පහත සඳහන් අධ්‍යාපනික සුදුසුකම් සහ අවශ්‍ය පළපුරුද්ද ඇති බවත් සනාථ කළ යුතුය :

(අ) (i) ගණිතය සහ භෞතික විද්‍යාව යන විෂයයන් ඇතුළත් පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතිකය හෝ ගණිතය සහ භෞතික විද්‍යාව යන විෂයයන් ඇතුළත් ඒ හා සමාන වෙනත් සහතිකයක්, හෝ

(ii) සිංහල/දෙමළ, ගණිතය සහ භෞතික විද්‍යාව යන විෂයයන් තුනද ඇතුළුව පිට පිට දෙවතාවකට නොවැඩි වාර ගණනකදී, විෂයයන් හයක් සඳහා ලබාගත් අධ්‍යයන පොදු සහතික (සාමාන්‍ය පෙළ) පත්‍රය.

සංලක්ෂ්‍යය :

(1) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර/අධ්‍යයන පොදු සහතික (සාමාන්‍ය පෙළ) පත්‍ර විභාගයේ දී හෝ ඒ හා සමාන වෙනත් විභාගයකදී ඇඳීම විෂයයෙන් ලබාගත් සාමාර්ථයක් ඇතොත් එය අමතර සුදුසුකමක් වනු ඇත.

(2) මෙහි පහත (ආ) උප ඡේදයෙහි නියමිත පුහුණුව සහ පළපුරුද්ද ඇති දෙපාර්තමේන්තුමය අපේක්ෂකයින්ට ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ගණිතය/අංක ගණිතය සහ සිංහල/දෙමළ යන විෂයයන් දෙකද ඇතුළුව විෂයයන් හයක් සඳහා ලබාගත් අධ්‍යයන පොදු සහතික (සාමාන්‍ය පෙළ) පත්‍රය හෝ ඒ හා සමාන වෙනත් සහතික පත්‍රයක් හෝ ඇත්නම් මෙම තනතුරට ඉල්ලුම් කිරීමට සුදුසුකම් ඇත.

(ආ) (i) පාංශු ප්‍රස්ථාරණය පිළිබඳව අඩුම වශයෙන් හය මාසයකටවත් පූර්ව පුහුණුවක් සහ පාංශු සමීක්ෂණ අත්පොත් අංක 18 හි සඳහන් ක්‍රියා පිළිවෙල අනුව පාංශු සමීක්ෂණ සහ පාංශු පරිශීලන සිතියම් ඒකාබද්ධ කිරීමේ සහ රාශිභූත කිරීමෙහි අඩුම වශයෙන් තුන් අවුරුද්දක වත් පළපුරුද්දක් තිබීම.

(ii) ඉහත (iv) (ආ) හි නියමිත පුහුණුව හා පළපුරුද්ද ඇති අයදුම්කරුවන් සොයා ගත නොහැකි නම්, නියමිත අධ්‍යාපන සුදුසුකම් ලබා ඇති අපේක්ෂකයින් අතුරින් සුදුස්සන් තෝරා ඔවුන් දෙපාර්තමේන්තුව මගින් අවුරුදු තුනක් පුහුණු කරවනු ලැබේ. මෙසේ බඳවා ගනු ලබන්නන්ට පළමුවැනි, දෙවැනි සහ තුන්වැනි අවුරුදු වල පිළිවෙලින් මසකට රු. 250, රු. 257.50, රු. 265 බැගින් සියලු දීමනා අන්තර්ගත දීමනාවක් ගෙවනු ලැබේ.

මෙම පුහුණුවන්නන්ට කුලියෙන් නිදහස් නිවාස සපයනු ලැබුවහොත් අංක 770 හා 69.09.15 දින දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ 4(X) (ආ) සඳහන් කුලී ප්‍රමාණය අය කරනු ලැබේ.

5. රජය යටතේ දැනට සේවය කරනු ලබන අයදුම්කරුවන් සිය අයදුම් පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

6. අයදුම්කරුවන් පහත දැක්වෙන ලියකියවිලි වල පිටපත් (මුල් පිටපත් නොවේ) තමන්ගේ ඉල්ලුම් පත්‍ර වලට අමුණා එවිය යුතුය. ඒවා ආපසු එවනු නොලැබේ.

(i) ලබා ඇති අධ්‍යයන සුදුසුකම් පිළිබඳ සහතික.

(ii) පාංශු ප්‍රස්ථාරණය පිළිබඳ පූර්ව පුහුණුව සම්බන්ධයෙන් වූ සහතික.

(iii) පාංශු සමීක්ෂණ හා පාංශු පරිශීලන සිතියම් (ඒකාබද්ධ කිරීමෙහි සහ රාශිභූත කිරීමෙහි) පළපුරුද්ද පිළිබඳ සහතික.

(iv) මෑතකදී ලබාගත් චරිත සහතික තුනක් (මින් එකක් අයදුම්කරු අන්තිමට උගත් පාඨශාලාවේ ප්‍රධානාචාර්ය තුමාගෙන් විය යුතුයි).

(v) උප්පැන්න සහතිකය.

(සැලකිය යුතුයි.—හොතිස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලාවල රෙගුලාසි පද්ධතියේ අවශ්‍යතාවයන් සඳහා නිකුත් කරන ලද සහතිකය හෝ බාරගනු නොලැබේ. උප්පැන්න ලියා පදිංචි නොවුනු අයදුම්කරුවකු සම්බන්ධයෙන් ඔහුගේ වයස පිළිබඳ තීරණය කිරීම සඳහා රෙජිස්ට්‍රාර් ජෙනරාල් විසින් වයස පිළිබඳ නිකුත් කර ඇති විශේෂ සහතිකය භාරගනු ලැබේ.)

7. ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වැනි ඡේදය ආරම්භයේ පළ කර ඇති රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල පොදු කොන්දේසිවලට අවධානය යොමු කෙරේ.

පී. එච්. පෙරේරා,
වාරිමාර්ග අධ්‍යක්ෂ.

1973. 06. 22 දින,
තැ. පෙ. 1138, කොළඹ 7,
වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ දීය.

### ආදර්ශ ආකෘති පත්‍රය

(සැලකිය යුතුයි.—ඉල්ලුම් පත්‍රය බහාලන ලියුම් කවරයේ වම්පස මුදුන් කෙලවරේ "පාංශු ප්‍රස්ථාරක තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය" යන පාඨය ලියා එය ලියාපදිංචි තැපෑලෙන් වාරිමාර්ග අධ්‍යක්ෂ වෙත එවිය යුතුය.)

### වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පාංශු ප්‍රස්ථාරක තනතුර

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.

2. ලිපිනය :————.

3. (අ) අයදුම්කරු උපන් දිනය හා ස්ථානය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය).

(ආ) පහත දැක්වෙන අයවලුන් උපන් ස්ථාන හා දිනය :—

(i) අයදුම්කරුගේ පියා :————.

(ii) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(iii) අයදුම්කරුගේ පියාගේ පියාගේ පියා :————.

4. ජාතිය :————.

5. විවාහකද, අවිවාහකද වැන්දඹුද යන බව :————.

6. අධ්‍යයන සුදුසුකම් සමත් වූ විෂයයන් සමග :————.
(සහතික පිටපත් අමුණන්න)

7. පාංශු ප්‍රස්ථාරණය පිළිබඳ පූර්ව පුහුණුවේ විස්තර :————.
(සහතික පිටපත් අමුණන්න).

8. පාංශු සමීක්ෂණ සහ පාංශු පරිශීලන සිතියම් ඒකාබද්ධ කිරීමෙහි සහ රාශිභූත කිරීමෙහි පළපුරුද්ද පිළිබඳ විස්තර (සහතික පිටපත් අමුණන්න) :————.

9. දැනට තනතුරක් දරන්නේ නම් එම තනතුර :————.
(ස්ථිරද, තාවකාලිකද යන බවත් සඳහන් කරන්න).

10. පාඨශාලාවෙන් අස්වූ පසු කළ රැකියා සහ/හෝ නැදෑරු අභ්‍යාස පිළිබඳ විස්තර :————.

11. මීට කලින් ආණ්ඩුවේ යම්කිසි දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක සේවය කළේ නම් එයින් අස්වීමට හේතුව සඳහන් කරන්න :————.

12. යම්කිසි සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියකදී වැරදිකරුවී ඇත්නම් එම වරද හා ලැබූ දඬුවම පිළිබඳ විස්තර සඳහන් කරන්න :————.

13. චරිත සහතික දී ඇති පුද්ගලයන් තිදෙනාගේ නම් සහ පදවි නාම :————.

1. :————.

2. :————.

3. :————.

මෙම අයදුම්පතෙහි මවිසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මම මෙයින් සහතික කරමි. මෙම අයදුම් පතෙහි කිසියම් අසත්‍ය හෝ වැරදි ප්‍රකාශයක් තිබුණ බව තෝරා ගැනීමට ප්‍රථම අනාවරණය වුව්හොත් මා එයින්ම නුසුදුසු වන බවත් තෝරා ගැනීමෙන් පසුව ඒ බව හෙළිදරව් වුවහොත් කිසිම වන්දියක් නොමැතිව මාව රාජකාරියෙන් පහකර දැමීමට හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

ස්ථානය :————.

දිනය :————.

7-420—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

### වවුනියා දිස්ත්‍රික්කයේ පුදුකුඩිඉරිප්පු ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධූරය

වවුනියා දිස්ත්‍රික්කයේ පුදුකුඩිඉරිප්පු ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධූරය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස මෙයින් ආරාධනා කරමි.

පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ අන්දමට සකස් කරන ලද අයදුම්පත් 1973 ජූලි 28 වැනි දිනට පෙර මා වෙත ලැබෙනසේ එවිය යුතුය.

2. මෙම තනතුර සඳහා ස්ථිර වැටුපක් ගෙවනු නොලැබේ. හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රුපියල් 10 බැගින් ගෙවනු ලැබේ.

3. අයදුම්කරුට පහත සඳහන් සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) අයදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 30 කට නොඅඩු හා 60 කට නොවැඩි වීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත වීම.

(ඇ) අයදුම්කරු ඉහත කී පුදුකුඩිඉරිප්පු ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවෙකු වීම.

(ඈ) (i) 1925 සිට 1944 දක්වා වූ කාලයෙහි දෙමළ පාඨශාලා හැරයාමේ සහතික පත්‍ර විභාගය හෝ, දෙමළ භාෂාව සහිත ඉංග්‍රීසි පාඨශාලා හැරයාමේ විභාගය හෝ, දෙමළ භාෂාව සහිත අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් සමත් වීම.

(ii) දෙමළ භාෂාව සහිත ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් සමත් වීම හෝ, ඒ හා සමාන හෝ, එයට උසස් විභාගයකින් සමත් වීම.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති උසස් අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක්.

**5. මෙම ධුරය සඳහා රජයේ සහ සංස්ථාවල සේවකයින්ගෙන් ද,** පළාත් පාලන ආයතනවල සාමාජිකයින්ගෙන් ද, අයදුම්පත් භාර ගනු ලැබේ.

6. අයදුම් පත් ලැබුණු බවට දැන්වීමක් කරනු නොලැබේ. අයදුම් පත් ලේඛණගත තැපැලෙන් එවිය යුතුය.

එල්. පී. වික්‍රමාරච්චි,
වවුනියා දිස්ත්‍රික්කයේ දිසාපති.

1973 ජුනි මස 18 වැනි දින,
වවුනියා, දිසාපති කායසීලයේ දිය.

ආදර්ශ අයදුම් පත්‍රය

**වවුනියා දිස්ත්‍රික්කයේ පුදුකුඩිඉරිප්පු ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය**

(1) අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
(පෙලපත් නාමය පැහැදිලි අකුරෙන්)

(2) ලිපිනය :————.

(3) ස්ථිර පදිංචි ස්ථානය සහ එහි පදිංචි කාලය :————.

(4) (අ) අයදුම්පත් භාරගන්නා දිනට සම්පූර්ණ වයස :————.

(ආ) උපන් දිනය සහ ස්ථානය :————.

(5) විවාහක අවිවාහක බව :————.

(6) අධ්‍යාපන සුදුසුකම් :————.

(7) දැනට කරන රක්ෂාව :————.

(8) මීට පෙර රැකියාවක් කලේ ද? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

(9) තමන් යහු දේපොලවල වටිනාකම සහ ප්‍රමාණයන්, විස්තර සහිත :————.

(10) අයදුම්කරු ණය ගැතිව සිටී ද? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

(11) අයදුම්කරු කිසියම් චෝදනාවකට වරදකරු වී අධිකරණය මගින් දඬුවම් ලබා තිබේ ද? :————.

(12) මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

7-259 --73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

**කෝපායි සහ නිර්වේලිගම්සභා ප්‍රදේශවලට හදිසි මරණ පරීක්ෂකවරුන් පත්කිරීම**

**කෝපායි සහ නිර්වේලි යන ගම් සභා ප්‍රදේශවලට හදිසි මරණ** පරීක්ෂක තනතුරක් සඳහා **හදිසි මරණ පරීක්ෂකවරයෙක් පත් කිරීම පිණිස එම** ගම්සභා ප්‍රදේශය තුල ස්ථිර පදිංචිකරුවන්ගෙන් **පමණක් ඉල්ලුම්පත්** යාපනය දිසාපති **විසින්** භාරගනු ලැබේ.

2. රජයේ, සංස්ථා සහ පළාත් පාලන ආයතනවල සේවකයන් ගෙන්, පළාත් පාලන ආයතනවල නියෝජිතයන්ගෙන් සහ 73.07.30 වැනි දිනට වයස අවුරුදු 30ට අඩු හෝ 60ට වැඩි අයගෙන් අයදුම්පත් **භාරගනු නොලැබේ.**

3. සෑම අයදුම්කරුවකු විසින්ම පහත සඳහන් විස්තර හා ලියකියවිලි සැපයිය යුතුව ඇත.

(i) සම්පූර්ණ නම සහ ලිපිනය.
(ii) පදිංචි ස්ථානය.
(iii) වයස සහ උපන් දිනය.
(iv) විවාහකද අවිවාහකද යන වග.
(v) අධ්‍යාපන සුදුසුකම් :—ඉංග්‍රීසි, දෙමළ.
(vi) දැනට දරන හෝ කලින් දැරූ තනතුර හෝ තනතුරු.
(vii) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක්.

**එම්. ටී. ඩබ්. අමරසේකර,**
යාපනය දිසාපති.

1973.06.26 දින,
යාපනය දිසාපති කාර්යාලයේ දී ය.

7-271—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

**අම්පාර දිස්ත්‍රික්කයේ නින්දවූර් කොට්ඨාශයේ උප්පැන්න හා මරණ ලේකම් ධුරය**

නින්දවූර් උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුල ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි පදිංචිව සැහෙන දේපළක් ද, ගම්වාසීන්ගේ සැලකිල්ලද අත්කර ගෙන ඇත්තාවූ හෝ ස්ත්‍රී, පුරුෂ දෙපක්ෂයෙන් ඉහත සඳහන් ඇබෑර්තුව සඳහා ඉල්ලුම්පත් **කැඳවනු ලැබේ. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට අයදුම්කරුවන් ගේ වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතුය.** රජයේ ස්ථිර සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව බල නොපායි.

2. අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කාර්යාල, ග්‍රාම සේවක කාර්යාල, පළාත් පාලන ආයතන කාර්යාල, ගම්බද උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජාමණ්ඩල, **ප්‍රසිද්ධ වෙළඳ** පොළවල් සහ සමුපකාර සමිති ආදී කොට්ඨාශය තුල පිහිටි **ප්‍රසිද්ධ ස්ථානයන්හි හා කාර්යාලයන්හි ප්‍රදර්ශණය කර ඇති දැන්වීම් වලින් බලාගත හැකිය.**

3. සියළුම ඉල්ලුම්පත් මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල ලියා, ඒවා ලියාපදිංචි තැපැලෙන් 1973 අගෝස්තු මස 10 වෙනි දිනට හෝ ඊට පෙර හෝ මා වෙත ලැබෙන **ලෙස එවිය යුතුය.**

**සෝමසිරි මුණසිංහ,**
අතිරේක දිස්ත්‍රික් ලේකම්,
දිස්ත්‍රික් ලේකම් වෙනුවට.

1973 ජූනි මස 25 දින,
අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

7–258– 73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

**පුත්තූර් ගම්සභා ප්‍රදේශයට හදිසි මරණ පරීක්ෂකවරුන් පත්කිරීම**

පුත්තූර් යන ගම් සභා ප්‍රදේශයට හදිසි මරණ පරීක්ෂක තනතුරක් සඳහා හදිසි මරණ පරීක්ෂකවරයෙක් පත් කිරීම පිණිස එම ගම් සභා ප්‍රදේශය තුල ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් ඉල්ලුම්පත් යාපනය දිසාපති **විසින් භාරගනු** ලැබේ.

2. රජයේ, සංස්ථා සහ පළාත් පාලන ආයතනවල සේවකයන් ගෙන්, පළාත් පාලන ආයතනවල නියෝජිතයින්ගෙන් සහ 73.07.30 වැනි දිනට වයස අවුරුදු 30 ට අඩු හෝ 60 ට වැඩි අයගෙන් අයදුම්පත් භාරගනු නොලැබේ.

3. සෑම අයදුම්කරුවකු විසින්ම පහත සඳහන් විස්තර හා ලියකියවිලි සැපයිය යුතුව ඇත.

(i) සම්පූර්ණ නම සහ ලිපිනය.
(ii) පදිංචි ස්ථානය.
(iii) වයස සහ උපන් දිනය.
(iv) විවාහකද අවිවාහකද යන වග.
(v) අධ්‍යාපන සුදුසුකම් :—ඉංග්‍රීසි, දෙමළ.
(vi) දැනට දරන හෝ කලින් දැරූ තනතුර හෝ තනතුරු.
(vii) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක්.

එම්. ටී. ඩබ්. අමරසේකර,
යාපනය දිසාපති.

1973. 6. 26 දින,
යාපනය දිසාපති කාර්යාලයේ **දීය.**

7-269 --73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

## ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

කොමිෂන් සභා සේවයේ පහත සඳහන් තාවකාලික තනතුරු සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් ඉල්ලුම්පත්‍ර මෙයින් කැඳවනු ලැබේ.

(අ) 1. **අධ්‍යක්ෂ මුදල්.**—කොමිෂන් සභා සේවයේ II වෙනි ශ්‍රේණියේ තනතුරු.

2. **වැටුප් ක්‍රමය.**—රු. 1,500—10 × 50—රු. 2,000 (මාසික).

3. **වයස.**—1973.07.27 දිනට වයස අවුරුදු 30 සහ 45 අතර විය යුතුයි.

4. **සුදුසුකම්.**—රජයේ දෙපාර්තමේන්තුවක සංස්ථාවක හෝ පෞද්ගලික වාණිජ ආයතනයක යටත් පිරිසෙයින් අවුරුදු 5 ක පළපුරුද්දක් ඇති වරලත් ගණකාධිකාරිවරයෙකු හෝ පිරිවැය හා කළමනාකාර ගණකාධිකාරිවරයෙකු වීම හෝ රජයේ ගණකාධිකාරි සේවයේ I හෝ II ශ්‍රේණියේ ගණකාධිකාරිවරයෙකු වන අතර පරිපාලන අභ්‍යාස ආයතනයේ රාජ්‍ය මූල්‍ය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය ලත් අයෙකු **වීම.**

(ආ) 1. **නීති නිලධාරි.**—කොමිෂන් සභා සේවයේ III වැනි ශ්‍රේණියේ තනතුර.

2. **වැටුප් ක්‍රමය.**—රු. 1,250—10 × 50—රු. 1,750 (මාසික).

3. **වයස.**—1973.07.27 දිනට වයස අවුරුදු 30 සහ 50 අතර විය යුතුය.

4. **සුදුසුකම්.**—නොතාරිස් කටයුතු පිළිබඳ පුළුල් පළපුරුද්දක් ඇතුව, නීතිඥයෙකු වශයෙන් අවුරුදු 10 ක පළපුරුද්දක් තිබිය යුතුය.

(රාජ්‍ය සේවයේ, සංස්ථාවල හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුක්ත නීතිඥවරුන් සම්බන්ධයෙන් පළපුරුද්ද පිළිබඳ සුදුසුකම් බලපානු නොලැබේ.)

**පොදු කොන්දේසි :**

1. පළපුරුද්ද සහ සුදුසුකම් අනුව අයදුම්කරුවන් වැටුප් ක්‍රමයේ සුදුසු පියවරක තැබීම සලකා බලනු ලැබේ.

2. රාජ්‍ය සේවයේ, සංස්ථාවල හා ව්‍යවස්ථාපිත බල මණ්ඩලවල සේවයේ නියුක්ත අයදුම්කරුවන් විසින් ස්වකීය ඉල්ලුම් පත්‍ර අදාල දෙපාර්තමේන්තු, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල ප්‍රධානීන් මාගීයෙන් ඉදිරිපත් කළ යුතුය.

3. රාජ්‍ය සේවයේ, සංස්ථාවල හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුක්ත අයදුම්කරුවන් සම්බන්ධයෙන් වයස සීමාවන් බලපානු නොලැබේ.

4. සේවා කොන්දේසි කොමිෂන් සභා සේවකයින්ට අදළ පරිදි වේ.

5. ඉල්ලුම්පත්‍ර පහත දැක්වෙන ආකෘති පත්‍රය පරිදි සකස් කර ඉදිරිපත් කළ යුතුය.

6. 1973.7.27 දින හෝ ඊට පෙර කොමිෂන් සභාව වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ යුතුයි.

සභාපති,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව,
තැපැල් පෙට්ටිය 1526,
සී. 82, ග්‍රෙගරි මාවත,
කොළඹ 7.
1973.7.4.

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය
### ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

1. ඉල්ලුම් කරන තනතුර :————.

2. සම්පූර්ණ නම (අගට යෙදෙන නම මුලින් සඳහන් කරන්න : ————.

3. ලිපිනය :————.

*4. උපන් දිනය :————.

5. ඉල්ලුම් පත්‍රය භාර ගන්නා අවසාන දිනයට වයස :— අවුරුදු :——, මාස :——, දින :——.

6. ජාතිය :————.

*7. සුදුසුකම් :—
අධ්‍යාපනික (විෂයයන්, දිනයන් හා ආයතනයේ නම් සහිතව) : ————.
වෘත්තීය (දිනයන් හා ආයතනයන්ගේ නම් සහිතව) : ————.

*8. නියුක්තව සිටි රැකියාවල විස්තර (ලැබුණු වැටුප් හා උසුලන ලද තනතුරුවල විස්තර සැපයිය යුතුය.) :————.

*9. පළපුරුදුකම් :————.

*10. විශේෂ සුදුසුකම් .————.

*11. සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය :————.

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද සියළු විස්තර සත්‍ය බවටත් නිවැරදි බවටත්, ඒ සම්බන්ධ ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ හැකි බවටත්, මම සහතික කරමි. මෙහි සඳහන් යම් විස්තරයක් අසත්‍ය බව හෝ වැරදි බව මා තනතුරට තෝරා ගැනීමට ප්‍රථම සොයා ගතහොත්, එයින් මා තනතුරට නුසුදුස්සකුවනු ලබන බවත්, පත් කිරීමෙන් පසු සොයාගතහොත් වන්දි නොගෙවා පහකරනු ලබන බවත් මම දනිමි.

————,
දිනය :————. අයදුම්කරුගේ අත්සන.

* අදල ලියකියවිලි හා සහතිකවල පිටපත් ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය.

7–430—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

### ආධුනික සැළසුම්කරු තනතුරු

1973 ජූනි මස 22 දින රජයේ ගැසට් පත්‍රයේ පළ වූ ආධුනික සැළසුම්කරු තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවීමේ දැන්වීමට අමතර වශයෙනි.

ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනය 1973.7.17 වෙනි දින දක්වා දීර්ඝ කරන ලදී.

ජේ. බී. වීරරත්න,
ගොඩනැගිලි අධ්‍යක්ෂ වෙනුවට.

1973 ජූලි මස 3 වෙනි දින,

7-360—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

1973 ජූනි මස 14 වෙනි දින රජයේ ගැසට් පත්‍රයේ පළ වූ පරිපාලන ඕවර්සියර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවීමේ දැන්වීමට අමතරවයි.

ඉල්ලුම්පත් භාරගන්නා අන්තිම දිනය 1973. 07. 16 වෙනි දින දක්වා දීර්ඝ කරන ලදී.

ගොඩනැගිලි අධ්‍යක්ෂ.

1973 ජූලි මස 02 වෙනි දින,
ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,
කොළඹ 1.

7–388—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

## සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව—ගුවන් ගමනා ගමන පාලක (II ශ්‍රේණිය) තනතුර

සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවේ ගුවන් ගමනා ගමන පාලක (II ශ්‍රේණිය) තනතුර සඳහා අයදුම් පත් මෙයින් කැඳවනු ලැබේ. මේ සඳහා වන අයදුම් පත් පහත දැක්වෙන ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කොට 1973. 08. 03 වැනි දිනට හෝ ඊට පෙර සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ, තැ. පෙ. 535, ලෝටස් පාර, කොළඹ—1, යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය.

2. **ඒකාබද්ධ වැටුප් පරිමාණය.**—වර්ෂයකට රුපියල් 5,736 න් පටන් ගෙන රුපියල් 144 බැගින් වන වාර්ෂික වර්ධකයන් 6 කින් සහ රුපියල් 180 බැගින් වන වාර්ෂික වර්ධකයන් 8 කින් වර්ෂයකට රුපියල් 8,040 දක්වා වැඩි වන්නකි.

3. **වයස් සීමාව.**—1973.08.03 වැනි දිනට වයස අවුරුදු 21 ට නොඅඩු විය යුතු වන අතර, අවුරුදු 30 ට නොවැඩි විය යුතුය. දැනටමත් රජයේ සේවයේ නියුක්ත වූවන්ට ඉහත වයස් සීමාව බල නොපානු ඇත.

4. **අයදුම්කරුවන්ට තිබිය යුතු අධ්‍යාපනික හා සෙසු සුදුසුකම්.**—

(අ) (i) අපහසුවකින් තොරව ඉංග්‍රීසි භාෂාවෙන් කථා කිරීමේ හැකියාවකුත් ඇතිව ගණිතය (ශුද්ධ හෝ ව්‍යවහාරික), භෞතික විද්‍යාව සහ ඉංග්‍රීසි යන විෂයයන්ගෙන් සම්මාන සාමාර්ථයක් සහිත ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ;

(ii) අපහසුවකින් තොරව ඉංග්‍රීසි භාෂාවෙන් කථා කිරීමේ හැකියාවකුත් ඇතිව ගණිතය (ශුද්ධ හෝ ව්‍යවහාරික), භෞතික විද්‍යාව සහ ඉංග්‍රීසි යන විෂයයන්ගෙන් සම්මාන සාමාර්ථයකුත්

වෙනත් විෂයයන් 3 කින් සාමාර්ථ්‍යයනුත් සහිත අධ්‍යයන පොදු සහතික පත්‍රය (සාමාන්‍ය පෙළ) හෝ ;

(iii) ඊට සමාන හෝ උසස් ශාස්ත්‍රීය සුදුසුකම් සහ

(ආ) (i) වාණිජ නියමු බලපත්‍රයක් හෝ පෞද්ගලික නියමු බලපත්‍රයක් හෝ ;

(ii) ගුවන් යාන්ත්‍රිකයකු වශයෙන් පැය 500 කට නොඅඩු ගුවන් පළපුරුද්දක් සහිතව ගුවන් යාන්ත්‍රික බලපත්‍රයක් හෝ

(iii) පිළිගත් ආයතනයකින් ලබාගත් ගුවන් ගමනා ගමන පාලනය පිළිබඳ ප්‍රවීණතා සහතික පත්‍රයක්.

(ඇ) ඉහත 4(ආ) ඡේදයෙහි නියමිත සුදුසුකම් නොමැති වුවද, භෞතික විද්‍යාව හෝ ගණිතය විෂයයක් වශයෙන් ඇතිව, පිළිගත් විශ්ව විද්‍යාලයක බී. එස්. සී. උපාධියක් ලබා ඇති අයදුම්කරුවන් ද මේ සඳහා ඉල්ලුම් කිරීමට සුදුස්සෝ වෙති.

**5. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. තෝරා ගනු ලැබූ අයදුම්කරු රජයේ අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. ඔහුගේ පත්වීම ප්‍රථමයෙන් තුන් අවුරුදු පරිවාස කාලසීමාවකට යටත් වනු ඇත.

**සටහන**—(i) 1971. 12. 31 දින රජයේ සේවයේ විශ්‍රාම වැටුප් සහිත ස්ථිර තනතුරක් දැරූ යම්කිසි පුද්ගලයකු පත්කළහොත් නව තනතුරෙහි ද විශ්‍රාම වැටුප් හිමිකම් භුක්ති විඳීමට ඔහුට හැකිවනු ඇත.

(ii) විශ්‍රාම වැටුප් සහිත ස්ථිර තනතුරක් දරණ රජයේ සේවකයෙකු තෝරා ගනු ලැබුවහොත් පළමුකොට ඔහුගේ පත්වීම නියමිත කාලයක් සඳහා වැඩබැලීමේ පදනමක් මත වනු ඇත.

6. පහත සඳහන් ලියවිලිවල පිටපත් (මුල් පිටපත් නොවේ) අයදුම් පතට ඈමිණිය යුතුය. මෙම පිටපත් අයදුම්කරුවනට ආපසු එවනු නොලැබේ. සියලුම සහතික පත් හා ලියවිලිවල මුල් පිටපත් අයදුම් කරුවන් විසින් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය. මෙම සහතික පත්‍ර හෝ ලියවිලි කිසිවක් ඉදිරිපත් නොකිරීම අයදුම්කරු නුසුදුස්සෙකු බවට පත් කිරීමට හේතුවනු ඇත.

(අ) උප්පැන්න සහතිකය.

(සැ. යු.—බෞතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා සඳහා වන නියෝග සංග්‍රහයෙහි කායශීයන් සඳහා නිකුත් කරන ලද උප්පැන්න සහතිකය හෝ බාරගනු නොලැබේ.)

(ආ) උසස්ම අධ්‍යාපනික සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්.

(ඈ) කලින් පළපුරුද්ද/කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) වැනි ඡේදය ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවාවේ තනතුරුවලට කෙරෙන පත් කිරීම් පිළිබඳව පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

8. අයදුම් පත් හෝ මේ තනතුරට අදාළ වන අනෙකුත් ලියවිලි සියල්ලක්ම සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ වෙන යම් නිලධාරියෙකුගේ නමට පෞද්ගලිකව නොඑවිය යුතුය.

සී. ඩබ්ලිව්. ඇම්. අපොන්සො,
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ.

1973 ජූනි 28 වැනි දින,
තැ. පෙ. 535, ලෝටස් පාර,
කොළඹ—1.

අයදුම් පතෙහි ආකෘතිය

ගුවන් ගමනා ගමන පාලක (II ශ්‍රේණිය) තනතුර

(1) සම්පූර්ණ නම :————.

(2) තැපැල් ලිපිනය :————.

(3) උපන් දින හා වයස :————.

(4) ඔබ ලංකාවේ පුරවැසියෙකු වන්නේ ;

(i) පරම්පරාවෙන් ද ?————.
නැතහොත්

(ii) ලියාපදිංචි වීමෙන් ද ?

(5) සමත්වූ උසස්ම විභාගය :————.
(විෂයයන් සඳහන් කළ යුතුයි)

(6) සමත් වූ කාර්මික විභාගය :————.

(7) පළපුරුද්ද :————.

(8) විශේෂ සුදුසුකම් හා හිමිකම් :————.

(9) දැනට කරන/කලින් කළ රක්ෂාවල් පිළිබඳ විස්තර :————.

මේ අයදුම් පතෙහි මවිසින් සපයනු ලැබ ඇති විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි විස්තර කිසිවක් අසත්‍ය බවට හෝ වැරදි බවට ඔප්පු වුවහොත් මේ පදවියට මා පත් වීමට නුසුදුසු වන බව හා පත්වීමෙන් පසුව අසත්‍යතාවයක් ඔප්පු වුවහොත් කිසිම වන්දියකට මා අහිමි වී පදවියෙන් පහකර දමනු ලැබීමට ද හේතුවන බව හොඳාකාර දන්නා බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

7-313—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

## භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව

### කාර්මික සහකාර තනතුර (පාෂාණ විද්‍යා රසායනාගාරය)

භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්මික සහකාර තනතුර සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙම දැන්වීම අගට යොදා ඇති ආකෘති පත්‍රය අනුව පිළියෙල කළ අයදුම් පත්‍ර, 1973 අගෝස්තු 31 වැනි දින හෝ ඊට පෙර කොළඹ 2, ශ්‍රී ජිනරතන පාරේ අංක 48 දරන ස්ථානයේ භූ විද්‍යා සමීක්ෂණ අධ්‍යක්ෂ වෙත ලැබෙනසේ එවිය යුතුය.

**2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති සහ කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. පත්කරනු ලබන්නා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. පත්වීම ප්‍රථමයෙන් තුන් අවුරුදු පරිවාස කාල සීමාවක් මතය.

**සටහන :** විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන රජයේ සේවකයෙකු තෝරාගනු ලැබුවහොත් ඔහු පළමුවෙන් අළුත් තනතුරෙහි අවුරුදු එකක කාලයක් වැඩ බැලීම සඳහා පත් කරනු ලැබේ.

තෝරාගනු ලබන අපේක්ෂකයා භූ විද්‍යා සමීක්ෂණ අධ්‍යක්ෂ විසින් නියම කරනු ලැබිය හැකි පුහුණුවක් ලබාගත යුතුය.

**3. වැටුප් ක්‍රමය :** තනතුරට අදාල ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේය : රු. 5,736—6×144, 8×180 සහ 6×240—රු. 9,480 දක්වා වනු ඇත. වාර්ෂික වැටුප රු. 6,780, රු. 7,500 සහ රු. 8,280 ට නැගීමට පෙර කාර්යක්ෂමතා කඩඉම් ඇත.

(ඉහත සඳහන් වැටුප් ක්‍රමය 1969. 10. 01 දිනට පෙර මේ තනතුරට අදාලවූ රුපියල් 3,180—6×120, 8×180, 6×240—රු. 6,780 වාර්ෂික වැටුප් ක්‍රමයට අනුරූපවේ.)

තෝරාගත් අයදුම්කරුගේ සුදුසුකම් සහ පළපුරුද්ද අනුව, ඔහු වැටුප් පරිමාණයෙහි ඉහළ ස්ථානයක තැබීම සුදුසුයැයි පෙනී ගියහොත්, භාණ්ඩාගාරයෙන් විමසා එසේ කරනවා ඇත.

**4. අවශ්‍ය සුදුසුකම් :**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයෙන් සහ හොඳ ශාරීරික සනීපයෙන් යුක්තබව.

(ආ) පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියකු බව.

(ඇ) 1973 අගෝස්තු 31 වන දිනට වයස අවුරුදු 20 ට නොඅඩු බව සහ අවුරුදු 30 ට නොවැඩි බව, (දැනටමත් රජයේ සේවයේ නියුක්ත අයගේ ඉල්ලුම් පත් වයස් සීමාවන් නොතකා සලකා බලනු ඇත.)

(ඈ) ශුද්ධ හෝ ව්‍යවහාරික ගණිතය හෝ ගණිතය සහ භෞතික විද්‍යාව හෝ රසායන විද්‍යාව විෂයයන් වශයෙන් ඇතිව පිළිගත් විශ්ව විද්‍යාලයක, විද්‍යාවේදී (සාමාන්‍ය) උපාධිධාරියෙක් බව. උපාධිය සඳහා විෂයයක් වශයෙන් භූ විද්‍යවෙන් හෝ අදාල විද්‍යාවන් පිළිබඳ රසායනාගාර සහ ක්ෂේත්‍ර ක්‍රම පිළිබඳ පළපුරුද්දක් ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(ඉ) දෙපාර්තමේන්තුවේ පසළොස් වර්ෂයකට නොඅඩු සේවයක් ඇති භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර සහකාරවරුන්ගෙන් හා රසායනාගාර සහකරුවන්ගෙන්ද අයදුම් පත් භාරගනු ලැබේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය. (සැ. යු. අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතිස්ම සහතික භාරගනු නොලැබේ.)

(ආ) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්. මින් එකක් අධ්‍යයන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඇ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඉ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන රජයේ සේවයේ නියුක්ත නිලධාරීන්ගේ ඉල්ලුම් පත්‍ර, එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නියමිත දිනට පෙර ලද බව හා ප්‍රමාදවීම ගැන පිළිගත හැකි කරුණු ඉදිරිපත් කරමින් එම ඉල්ලුම් පත්‍ර පිළිගන්නා මෙන් නිර්දේශ නොකළහොත් එවැනි ඉල්ලුම් පත්‍ර භාරගනු නොලැබේ.

7. නියමිත දිනක සහ වේලාවක මෙම කාර්යාලයේදී පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයකට අයදුම්කරුවන් පෙනී සිටීමත් අවශ්‍ය වනු ඇත. මේ සඳහා ගමන් ගාස්තු කිසිවක් ගෙවනු නොලැබේ.

8. සියළුම අයදුම්පත්, භූ විද්‍යා සමීක්ෂණ අධ්‍යක්ෂ වෙත හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නාමට පුද්ගලිකව නොඑවිය යුතුය.

9. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වන ඡේදයේ ආරම්භයේ සඳහන්, රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරවනු ලැබේ.

ඕ. බී. පට්ටිආරච්චි,
භූ විද්‍යා සමීක්ෂණ අධ්‍යක්ෂ.

භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව,
48, ශ්‍රී ජිනරතන පාර,
කොළඹ 2.
1973 ජූනි 28 වැනි දින.

### ආදර්ශ අයදුම් පත

භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව—කාර්මික සහකාර තනතුර

1. (අ) සම්පූර්ණ නම :————.
(පැහැදිලි අකුරෙන්)

(ආ) පෙලපත් නාමය :————.

(ඇ) වෙනත් නම් :————.

2. ලිපිනය :————.

(ලිපිනයෙහි වෙනස්වීමක් වුවහොත් ඒ බව වහාම දැන්විය යුතුයි.)

3. (අ) උපන් දිනය :————.

(ආ) 1973 අගෝස්තු 31 වැනි දිනට වයස :————.

4. ජාතිය :————.

(පරම්පරාවෙන්ද නැතහොත් ලියාපදිංචිවීමෙන්ද යන බව සඳහන් කරන්න. ඔබ ලියාපදිංචිවීමෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් නම්, ඔබට නිකුත් කර ඇති පුරවැසි සහතිකයේ යොමු අංකය සහ දිනය සඳහන් කරන්න.)

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරුගේ :————.

(ආ) පියාගේ :————.

(ඇ) පියපස මුත්තාගේ :————.

(ඈ) පියපස මී මුත්තාගේ :————.

(අයදුම්කරු ශ්‍රී ලංකාවේ උපන්නේ නම්, (අ) වලට අමතරව, (ආ) හෝ (ඇ) සහ (ඈ) සම්පූර්ණ කළ යුතුය. ඔහු/ඈ උපන්නේ ශ්‍රී ලංකාවේ නොවේ නම්, (අ) වලට අමතරව, (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) සම්පූර්ණ කළ යුතුය.)

6. අයදුම්කරු විවාහකද, අවිවාහකද හෝ වැන්දඹුද :————.

7. ඉගෙනීම ලත් පාසැල් හා විද්‍යාල, ඒවාට ඇතුලත්වූ සහ අස්වූ දිනයන්ද සහිතව :—

(අ) පොදු අධ්‍යාපනය සඳහා :————.

(ආ) වෘත්තීය අධ්‍යාපනය සඳහා :————.

8. ක්‍රීඩා ආදියෙන් ලබා ඇති විශිෂ්ඨතාවයන් වෙතොත් ඒ පිළිබඳ විස්තර :————.

9. (අ) ඔබ මුදල් කරදරවලින් නිදහස් අයෙක්ද, එසේ නැත්නම් ඔබේ වගකීම් හෙවත් බැඳීම් ප්‍රමාණය කොපමණද ? :————.

(ආ) සාපරාධී වරදක් වෙනුවෙන් ඔබට විරුද්ධව උසාවියක නඩු පවරා තිබේද ? එසේ නම්, දින සහ නඩු අංක දක්වමින් සම්පූර්ණ විස්තර සඳහන් කරන්න.

10. අධ්‍යාපනික, වෘත්තීය සහ කාර්මික සුදුසුකම් :————.
(දිනයන්, පංති වෙතොත් ඒවාද, පෙනී සිටි විෂයයන් සහ ආයතනවල නම්ද සහිත කාර්මික සුදුසුකම් ආදිය පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න.)

11. දැන් රක්ෂාව සහ කළින් දැරූ තනතුරු කිසිවක් වෙතොත් :————.

12. විශේෂ අයිතිවාසිකම්, සුදුසුකම්, පුහුණුවීම් හෝ පළපුරුදුකම් :————.

13. ඔබ ගැන තොරතුරු දැන ගැනීමට හැකි තිදෙනෙකුගේ තනතුරු සහිත නම්, ලිපිනයන් :—

1.

2.

3.

මෙම අයදුම්පතෙහි දැක්වෙන සියළුම තොරතුරු සත්‍ය සහ නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කර ඇති යම් කරුණක් වැරදි හෝ අසත්‍ය බව හෝ පත්වීම දෙන්නට පෙර එළිදරව් වුවහොත් මා නුසුදුස්සකු වීමටත් ඒ බව පත්වීම ලැබුවාට පසු එළිදරව් වුවහොත් කිසිම වන්දි ගෙවීමක් නැතිව මා නිලයෙන් අස් කිරීමටත් යටත් වන බවද, මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

ස්ථානය :—

දිනය :—

7-274—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

### වී අලෙවි මණ්ඩලය

### සහකාර ගණකාධිකාරී IV වෙනි ශ්‍රේණිය

යථෝක්ත තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර 1973.07.27 වෙනි දිනට හෝ ඊට පෙර පහත සඳහන් අය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අධ්‍යාපන, චරිත හෝ උප්පැන්න සහතික වල පිටපත්ද ඊට අමුණා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර අඩංගු ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ " සහකාර ගණකාධිකාරි IV වෙනි ශ්‍රේණිය තනතුර " යනුවෙන් සඳහන් කළ යුතුය.

2. සුදුසුකම්.—වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ මධ්‍ය පරීක්ෂණයෙන් සාමාර්ථයක් හෝ පිරිවැය හා වැඩ ගණකාධිකාරී පරීක්ෂණයේ 1 වෙනි 2 වෙනි හෝ 3 වෙනි කොටස් හෝ සහතික ලත් ගණකාධිකාරී පරීක්ෂණයේ 1 වෙනි 2 වෙනි හා 3 වෙනි කොටස් සම්පූර්ණ කර තිබීම. එම සහතික ලැබීමෙන් පසු අඩුම වශයෙන් අවුරුදු 2ක පළපුරුද්ද.

අභ්‍යන්තර ගිණුම් පරීක්ෂණ පිළිබඳ පළපුරුද්දක් ඇති අයදුම් කරුවන් කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

3. වැටුප්.—මසකට රු. 800—10×40—6×50—රු. 1,500 ක් වේ. රු. 1,200 න් ඔබ්බට පිවිසිය හැක්කේ සම්පූර්ණ වෘත්තීය සුදුසුකම් ලබාගැනීමෙන් පසුවය.

4. වයස.—ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 50 ට නොවැඩි විය යුතුය. රජයේ හෝ සංස්ථාවල සේවකයින්ට වයස සීමාව බල නොපානු ඇත.

5. පොදු කොන්දේසි :

(අ) ලාංකිකයෙක් විය යුතුයි.

(ආ) තෝරා ගනු ලබන අයදුම්කරු 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන වලටත් රජයේ භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා හා මතුවට පන වනු ලබන සියළුම නීතිරීති වලටත් එකඟව කටයුතු කළ යුතුය.

(ඇ) රජයේ හා සංස්ථා සේවකයන් තම ඉල්ලුම් පත්‍ර තම දෙපාර්තමේන්තු හෝ සංස්ථා ප්‍රධානීන් මගින් එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වනු නොලැබේ.

පරිපාලන අධිකාරී,
වී අලෙවි මණ්ඩලය.

වී අලෙවි මණ්ඩලය,
අංක 5, එලිබැන්ක් පාර,
කොළඹ 5,
1973.06.28 දින.

7-383—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

## ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩලවල ඇබෑර්තු

### ලඝුලේඛක තනතුරු

ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩලවල ලඝුලේඛක තනතුරු සඳහා ස්ථාන මාරුව සහිත ලඝුලේඛක සේවයේ (ඉංග්‍රීසි මාධ්‍යය) ස්වකීය පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටින නිලධාරීන්ගෙන් (කලින් විදේශ දූත මණ්ඩලවල සේවය කර ඇති අයද ඇතුළුව) අයදුම්පත් කැඳවනු ලැබේ.

2. අයදුම්පත් මේ හා ඇති උපලේඛනයෙන් පෙන්නුම් කෙරෙන පත්‍රයේ ආකාරයට විය යුතු අතර, ඒවා දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළයුතු වේ. තවද, අයදුම්කරු විදේශ සේවය සඳහා සුදුසු බවට හා තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරෙන් වහාම මුදා හැරිය හැකි බවටත්, අයදුම්පතේ සඳහන් කර ඇති විස්තර නිවැරදි බවටත් අයදුම්කරු දැනට සේවය කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ සටහනක් අයදුම්පත සමඟ විය යුතුය.

3. සිංහල යතුරු ලිවීම පිළිබඳව දැනුමක් ඇති නිලධාරීන්ගේ අයදුම්පත් විශේෂයෙන් සලකා බලනු ලැබේ.

4. තෝරා ගනු ලබන නිලධාරීන් විදේශ සේවය සඳහා ශාරීරික වශයෙන් සුදුසුදැයි තීරණය කරනු වස් ඔවුන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතුය.

5. තෝරාගනු ලබන නිලධාරීන්ට මූලික වශයෙන් අවුරුදු හතරක කාලයක් තුළ විදේශයේ සේවය කිරීමට නියමවනු ඇත.

6. තෝරාගනු ලබන නිලධාරීන්හට ඔවුන් දැනට දරන තනතුරට හිමි කල්පිත මූලික වැටුප ලැබෙන අතර, ඊට අමතරව, ශ්‍රී ලංකාවේදී ගෙවනු ලබන ඒකාබද්ධ වැටුප හා විවාහක දීමනාව වෙනුවට විදේශ දීමනාවක් ගෙවනු ඇත. සෙසු සේවා කොන්දේසි ශ්‍රී ලංකා විදේශ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සලසා ඇති අන්දමට වේ.

7. මෙයට කලින් මෙම අමාත්‍යාංශයට එවා ඇති ඉල්ලුම් පත් සැලකිල්ලට භාජනය කරනු නොලැබේ.

8. අයදුම්පත්, 1973 ජූලි 31 දින හෝ ඊට පෙර මෙම අමාත්‍යාංශය වෙත ලැබිය යුතුය.

වී. එල්. බී. මෙන්ඩිස්,
විදේශ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්.

1973 ජූලි 5 වන දින,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශය,
ජනරජ ගොඩනැගිල්ල,
කොළඹ 1.

### උපලේඛනය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පෙළපත් නාමය මුලින්) :———.

2. (අ) උපන් දිනය :———.
(ආ) 1973 ජූලි 31 වනදාට වයස :—
අවුරුදු :———, මාස :———.

3. ලිපිනය :—
(අ) කාර්යාලයීය :———.
(ආ) පෞද්ගලික :———.

4. ජාතිය :———.

5. විවාහක අවිවාහක බව :———.

6. විවාහක නම් දරුවන් සංඛ්‍යාව :———.

7. අධ්‍යාපනික සුදුසුකම් :———.

8. (අ) ස්ථාන මාරුව සහිත ලඝුලේඛක සේවයට ඇතුළු වූ දිනය :———.
(ආ) සේවයේ ස්ථිර කරනු ලැබූ දිනය :———.
(ඇ) වර්තමාන ශ්‍රේණිය :———.

9. වර්තමාන වාර්ෂික වැටුප :———.
(අ) ඒකාබද්ධ වැටුප :———.
(ආ) කල්පිත මූලික වැටුප :———.

10. (අ) ඉංග්‍රීසි ලඝුලේඛන වේගය :———. .
(ආ) ඉංග්‍රීසි යතුරු ලිවීමේ වේගය :———.

11. දැනට කරන රාජකාරිවල ස්වභාවය :———.

12. (අ) සිංහල භාෂාව පිළිබඳව ලබා ඇති ප්‍රවීණතාව :———.
(ආ) සිංහල යතුරු ලිවීම පිළිබඳව ලබා ඇති ප්‍රවීණතාව :———.

13. අයදුම්කරු කලින් සේවය කර ඇති විදේශ දූත මණ්ඩල හා කාල පරිච්ඡේදයන් :———.

14. වෙනත් සුදුසුකම් :———.
ඉහතින් දී ඇති විස්තර නිවැරදි බවට සහතික කරමි.

දිනය :———.

———,
අයදුම්කරුගේ අත්සන.

7–481—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

## තලාව කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක තනතුර

හම්බන්තොට දිස්ත්‍රික්කයේ නැගෙනහිර ගිරුවාපත්තුව ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ පිහිටි තලාව කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක තනතුර සඳහා අයදුම්පත් පහත දක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙළ කර 1973 අගෝස්තු මස 14 වැනි දින හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මෙදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

බල ප්‍රදේශය :

1. අංක 571 — තලාව ග්‍රාමසේවක කොට්ඨාශය
2. අංක 580 — දබරැල්ල ග්‍රාමසේවක කොට්ඨාශය
3. අංක 583 — දෙබොක්කාව ග්‍රාමසේවක කොට්ඨාශය

2. මෙම තනතුර සඳහා ස්ථිර වැටුපක් ගෙවනු නොලැබේ. මරණ පරීක්ෂණ සඳහා එකකට රු. 10 ක් බැගින් ගෙවනු ලැබේ. මීට අමතරව ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව ගමන් වියදම් හා යැපීම් දීමනා ගෙවනු ලැබේ.

3. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවෙක්ම :—

(අ) ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 30 ට නොඅඩු බවට හෝ අවුරුදු 60 ට නොවැඩි බවට,

(ආ) විශිෂ්ඨ චරිතයෙන් හා මනා සෞඛ්‍යයෙන් යුක්ත බවට,

(ඇ) ඉහත සඳහන් බලප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු බවට, හා

(ඈ) 1925 සහ 1944 අතර කාලයෙහි ස්වභාෂා පාඨමාලා සහතික පත්‍ර විභාගය හෝ සිංහල භාෂාව සහිත ඉංග්‍රීසි පාඨශාලා හැරයාමේ සහතිකපත්‍ර විභාගය හෝ සිංහල භාෂාව සහිත අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඒ හා සමාන වූ ඊට උසස් විභාගයකින් සමර්ථ වී ඇති බවටත්, පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ ඉල්ලුම්පත්‍ර සමග පහත සඳහන් සහතිකවල පිටපත් ඉදිරිපත් කළ යුතුය :—

(අ) උප්පැන්න සහතිකය,

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතිකය,

(ඇ) චරිතය පිළිබඳව මෑතකදී ලබාගත් සහතික දෙකක්, (ඉන් එකක් ග්‍රාමසේවකගෙන් විය යුතුයි),

(ඈ) ස්ථිර පදිංචිය සම්බන්ධයෙන් ග්‍රාම සේවකගේ සහතිකය.

5. මෙම ධුරය සඳහා රජයේ හා සංස්ථාවල සේවකයින්ගෙන් ද, පළාත් පාලන ආයතනවල සාමාජිකයින්ගෙන් ද අයදුම්පත් භාරගනු නොලැබේ.

6. ඉල්ලුම්පත් ලැබුණ බව දන්වනු නොලැබේ.

ඩී. එච්. ජේ. අබේගුණසේකර,
හම්බන්තොට දිස්ත්‍රික්කයේ දිසාපති.

1973 ජූලි මස 02 වැනි දින,
හම්බන්තොට දිසාපති කාර්යාලයේ දී ය.

### ආදර්ශ අයදුම්පත

### තලාව කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක තනතුර

1. (අ) අයදුම්කරුගේ සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) : ———.

   (ආ) අගට යෙදෙන නම් :———.

   (ඇ) අභිකුත් නම් :———.

   (ඈ) ලිපිනය :———.

2. ස්ථිරව පදිංචි ස්ථානය හා එහි පදිංචි කාලය :———.

3. (අ) 1973. 08. 14 දිනට වයස :—
   අවුරුදු :——, මාස :——, දින :———.

   (ආ) උපන් දිනය හා ස්ථානය :———.

4. විවාහකද, අවිවාහකද යන වග :———.

5. අධ්‍යාපන සුදුසුකම් :———.

6. දැනට කරන රක්ෂාව :———.

7. ණයගැති වී තිබේද ? එසේ නම්, විස්තර :———.

8. තමා සතු දේපළවල ප්‍රමාණය හා වටිනාකම :———.

9. ඉල්ලුම්කරු කිසියම් චෝදනාවට වරදකරු වී අධිකරණයකින් දඬුවම් ලබා තිබේද ? එසේ නම්, විස්තර :———.

10. මෙම තනතුර සඳහා ලබා ඇති විශේෂ සුදුසුකම් ඇත් නම් ඒ පිළිබඳ විස්තර :———.

මෙහි සඳහන් කර ඇති යම්කිසි කරුණක් වැරදි හෝ අසත්‍ය බව හෝ පත්වීම ලැබීමට පෙර අනාවරණය වුවහොත් මගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමටද, පත්වීම ලැබුවාට පසුව අනාවරණය වුවහොත් කිසිම වන්දියක් නොගෙවා මා තනතුරින් පහකරනු ලැබීමටද යටත් විය යුතු බැව් දනිමි. මෙම අයදුම්පතේ දැක්වෙන සියලුම තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි.

———,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :———.

7-391—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

### රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### රෙජිස්ට්‍රාර් සේවයේ I වැනි ශ්‍රේණියේ රෙජිස්ට්‍රාර් තනතුරු

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ රෙජිස්ට්‍රාර් සේවයේ I වැනි ශ්‍රේණියේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

ඒකාබද්ධ වාර්ෂික වැටුප් පරිමානය :—රු. 6720 —12×360 සහ 7×480—රු. 14,400.

2. **ඉල්ලුම්පත්.**—මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රයට අනුකූල වන ලෙස පිළියෙල කරන ලද ඉල්ලුම්පත්‍රය 1973 අගෝස්තු 14 වැනි දින හෝ එදිනට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය. ඉල්ලුම්පත්‍රය එවිය යුත්තේ ඉල්ලුම්කරු දැනට සේවය කරමින් සිටින දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ මාර්ගයෙනි.

3. **සුදුසුකම්.**—සංවිධානය කිරීමේ දක්ෂතාවය සහ පරිපාලන ශක්තිය ඇති පහත සඳහන් පන්තිවලට අයත් නිලධාරීන් මෙම තනතුරට අයදුම් කිරීමට සුදුස්සෝ වෙති :—

(අ) පත්වීම ස්ථිර ක ඇති, රෙජිස්ට්‍රාර් සේවයේ II ශ්‍රේණියේ රෙජිස්ට්‍රාර්වරු.

(ආ) සාමාන්‍ය ලිපිකරු සේවයේ අධි ශ්‍රේණියේ නිලධාරීන්.

(ඇ) සාමාන්‍ය ලිපිකරු සේවයේ I වැනි පන්තියේ වසර 6 ක සේවයේ ඇති නිලධාරීන් :

ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාල සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල වැඩ පිළිබඳ ලබා ඇති පළපුරුද්ද අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ඇත.

4. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :—**

(අ) ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරණ නිලධාරියෙකු විසින් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. ස්ථිර එහෙත් විශ්‍රාම වැටුප් අහිමි තනතුරක් දරණ නිලධාරියෙකු විසින් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(සාමාන්‍ය ලිපිකරු සේවයෙන් එක එල්ලේ බඳවා ගනු ලබන නිලධාරියෙකු නම් :—

(i) ප්‍රථමයෙන්ම වර්ෂයක් ගතවන තුරු පත්වීම වැඩබැලීමේ එකක් වේ. එම කාලය තුළ ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයට අනුකූලව වැඩ බැලීමේ තනතුරට අයත් වේතනය ගෙවනු ලැබේ.

(ii) රෙජිස්ට්‍රාර් සේවයේ තනතුරෙහි ස්ථිර කරනු ලැබීමෙන් පසු සාමාන්‍ය ලිපිකාර සේවයේ සාමාජිකත්වය අහිමි වන අතර එම සේවයට ආපසු යෑමේ අයිතියද නැතිවී යනු ඇත.

(ඇ) පත් කිරීමට තෝරා ගනු ලබූ නිලධාරියා විසින් මීට පෙර එම පරීක්ෂණයෙන් සමත් වී නොමැතිනම් දෙපාර්තමේන්තු රෙගුලාසි හා දෙපාර්තමේන්තුවේ පරිපාලනයට අයත් නොයෙකුත් ආඥා පනත් සම්බන්ධයෙන් ඔහුගේ දැනීම පිළිබඳව දෙපාර්තමේන්තු පරීක්ෂණයකින් පත් වීමේ දින සිට වර්ෂයක් ඇතුළත සමත් විය යුතුය. මෙම පරීක්ෂණයෙන් සමත් වීමට නොහැකි වුවහොත් වේතනාධිකය නවතනු ලැබේ. දෙවර්ෂයක් ඇතුළත සමත් වුවහොත් නවතා ගත් වේතනාධිකයන් සමග වේතනාධික ගෙවනු ලැබේ. දෙවර්ෂයක් ඇතුළත සමත් නොවුවහොත් විභාගය සමත් වීමට වර්ෂයකට වැඩියෙන් ගත් කාලයෙන් ප්‍රථම වේතනාධිකය ප්‍රමාද කරනු ලැබේ.

(ඈ) තෝරා ගනු ලබන නිලධාරියා දෙපාර්තමේන්තුව ඇතුළත රෙජිස්ට්‍රාර් සේවයේ ඕනෑම තනතුරකට හෝ ස්ථානයකට මාරු කරනු ලැබීමට හෝ යටත් ය.

(ඉ) රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත්, විශේෂයෙන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පණතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම මින්මතු පනවනු ලබන ව්‍යවස්ථාවන්ටද අනුකූලව ඔහු ක්‍රියා කළ යුතු වේ.

5. ඉල්ලුම්පත්‍ර හා ඒ පිළිබඳ වෙනයම් ලියකියවිලි එවිය යුත්තේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත මිස අමාත්‍යාංශයේ කිසියම් නිලධාරියෙකු වෙත පෞද්ගලික වශයෙන් නොවේ .

6. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

ඩී. සිරිවර්ධන,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

1973 ජූනි 29 වැනි දින,
කොළඹ 7,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ දී ය.

### ඉල්ලුම් පත්‍ර ආකෘති පත්‍රය

### රෙජිස්ට්‍රාර් සේවයේ I වැනි ශ්‍රේණියේ රෙජිස්ට්‍රාර් තනතුර

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :—
   අගට යෙදෙන නම :———.
   අනෙක් නම් :———.

2. රාජකාරි ලිපිනය :———.

3. උපන් දිනය :———.

4. (අ) රජය යටතේ ඉල්ලුම්කරු දැනට දරණ තනතුර :———.

   (ආ) රජය යටතේ සේවය කර ඇති කාලය සහ එක් එක් දෙපාර්තමේන්තුවක සේවය කර ඇති කාල පරිච්ඡේදයන් :———.

   (ඇ) (i) සේවයේ නම :———.

   (ii) පන්තිය/ශ්‍රේණිය සහ ඊට ඇතුළත් වූ දිනය :———.

5. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ වැඩ පිළිබඳ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ විස්තර :———.

6. (අ) සිංහලෙන් සමත්ව ඇති ඉහලම විභාගය :———.

   (ආ) භාෂා පිළිබඳ දැනුම :—

   (i) දෙමල :———.

   (ii) ඉංග්‍රීසි :———.

7. විශේෂ හිමිකම්, සුදුසුකම් ආදිය ඇත්නම් ඒ පිළිබඳ විස්තර :———.

8. අදල වෙනත් කරුණු :———.

මෙම අයදුම් පතෙහි මවිසින් සපයා ඇති කරුණු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. තවද, මෙහි අන්තර්ගත කරුණු අසත්‍ය බවට මා තෝරා ගැනීමට කලින් දැනගතහොත් මෙම තනතුර සඳහා මා නුසුදුස්සෙකු කිරීමට හැකි බවත්, පත් කිරීමෙන් පසුව අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

———.
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

7-253/1—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### රෙජිස්ට්‍රාර් සේවයේ II වැනි ශ්‍රේණියේ රෙජිස්ට්‍රාර් තනතුර

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ රෙජිස්ට්‍රාර් සේවයේ II වැනි ශ්‍රේණියේ රෙජිස්ට්‍රාර් තනතුරක් සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**ඒකාබද්ධ වාර්ෂික වැටුප් පරිමාණය.**—රු. 6,840—6×240 සහ 4×300—රු. 9,480.

2. **ඉල්ලුම්පත්.**—මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රයට අනුකූලවන ලෙස පිළියෙල කරන ලද ඉල්ලුම් පත්‍රය 1973 අගෝස්තු 14 වැනි දින හෝ එදිනට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය. ඉල්ලුම් පත්‍රය එවිය යුත්තේ ඉල්ලුම්කරු දැනට සේවය කරමින් සිටින දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ මාර්ගයෙනි.

3. **සුදුසුකම්.**—සංවිධානය කිරීමේ දක්ෂතාවය සහ පරිපාලන ශක්තිය ඇති පහත සඳහන් පන්තිවල නිලධාරීන් මෙම තනතුරට අයදුම්කිරීමට සුදුස්සෝ වෙති :—

(අ) සාමාන්‍ය ලිපිකරු සේවයේ I වැනි පන්තියේ නිලධාරීන්.

(ආ) රු. 5,160 නොඅඩු ඒකාබද්ධ වාර්ෂික වැටුපක් ලබන සාමාන්‍ය ලිපිකරු සේවයේ II වැනි පන්තියේ "අ" ඛණ්ඩයේ නිලධාරීන්.

ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාල සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල වැඩ පිළිබඳ ලබා ඇති පළපුරුද්ද අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ඇත.

4. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.**—(අ) ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරණ නිලධාරියෙකු විසින් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. ස්ථිර, එහෙත් විශ්‍රාම වැටුප් අහිමි තනතුරක් දරණ නිලධාරියෙකු විසින් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ආ) (i) ප්‍රථමයෙන්ම වර්ෂයක් ගතවන තුරු පත්වීම වැඩ බැලීමේ එකක් වේ. එම කාලය තුල ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයට අනුකූලව වැඩ බැලීමේ තනතුරට අයත් වේතනය ගෙවනු ලැබේ.

(ii) රෙජිස්ට්‍රාර් සේවයේ තනතුරෙහි ස්ථිර කරනු ලැබීමෙන් පසු සාමාන්‍ය ලිපිකාර සේවයේ සාමාජිකත්වය අහිමිවන අතර එම සේවයට ආපසු යෑමේ අයිතියද නැතිවී යනු ඇත.

(ඇ) පත්කිරීමට තෝරා ගනු ලබන නිලධාරියා විසින් මීට පෙර එම පරීක්ෂණයෙන් සමත්වී නොමැති නම් දෙපාර්තමේන්තු රෙගුලාසි හා දෙපාර්තමේන්තුවේ පරිපාලනයට අයත් නොයෙකුත් ආඥා පණත් සම්බන්ධනේ ඔහුගේ දැනීම පිළිබඳව දෙපාර්තමේන්තු පරීක්ෂණයකින් පත්වීමේ දින සිට වර්ෂයක් ඇතුලත සමත් විය යුතුය. මෙම පරීක්ෂණයෙන් සමත්වීමට නොහැකි වුවහොත් වේතනාධිකය නවතනු ලැබේ. දෙවර්ෂයක් ඇතුලත සමත්වුවහොත් නවතාගත් වේතනාධිකයන් සමඟ වේතනාධිකය ගෙවනු ලැබේ. දෙවර්ෂයක් ඇතුලත සමත් නොවුවහොත් විභාගය සමත්වීමට වර්ෂයකට වැඩියෙන් ගත් කාලයෙන් ප්‍රථම වේතනාධිකය ප්‍රමාද කරනු ලැබේ.

(ඈ) තෝරා ගනු ලබන නිලධාරියා දෙපාර්තමේන්තුව ඇතුලත රෙජිස්ට්‍රාර් සේවයේ ඕනෑම තනතුරකට හෝ ස්ථානයකට මාරු කරනු ලැබීමට යටත් ය.

(ඉ) රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත්, විශේෂයෙන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පණතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවන්වලද අනුකූලව ඔහු ක්‍රියා කල යුතුවේ.

5. ඉල්ලුම් පත්‍ර හා ඒ පිළිබඳ වෙනයම් ලියකියවිලි එවිය යුත්තේ රාජ්‍ය පරිපාලන, පලාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත මිස අමාත්‍යාංශයේ කිසියම් නිලධාරියෙකු වෙත පෞද්ගලික වශයෙන් නොවේ.

6. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි වලට අවධානය යොමු කරනු ලැබේ.

පී. සිරිවර්ධන,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පලාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

1973 ජූනි 29,
කොළඹ 7.
රාජ්‍ය පරිපාලන, පලාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ දී ය.

### ඉල්ලුම් පත්‍ර ආකෘති පත්‍රය

#### රෙජිස්ට්‍රාර් සේවයේ II වැනි ශ්‍රේණියේ රෙජිස්ට්‍රාර් තනතුර

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
අගට යෙදෙන නම :————.
අනෙක් නම් :————.

2. රාජකාරි ලිපිනය :————.

3. උපන් දිනය :————.

4. (අ) රජය යටතේ ඉල්ලුම්කරු දැනට දරන තනතුර :————.

(ආ) රජය යටතේ සේවය කර ඇති කාලය සහ එක් එක් දෙපාර්තමේන්තුවක සේවය කර ඇති කාල පරිච්ඡේද යන් :————.

(ඇ) සාමාන්‍ය ලිපිකාර සේවයේ I වැනි පන්තියේද නැතහොත් II වැනි පන්තියේ "අ" ඛණ්ඩයේද : ————.

(ii) සාමාන්‍ය ලිපිකාර සේවයේ II වැනි පන්තියේ "අ" ඛණ්ඩයේ නම් දැනට ලබන වාර්ෂික ඒකාබද්ධ වැටුප :————.

5. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ වැඩ පිළිබඳ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ විස්තර :————.

6. (අ) සිංහලෙන් සමත්ව ඇති ඉහලම විභාගය :————.

(ආ) භාෂා පිළිබඳ දැනුම :—

(i) දෙමළ :————.

(ii) ඉංග්‍රීසි :————.

7. විශේෂ හිමිකම්, සුදුසුකම් ආදිය ඇත්නම් ඒ පිළිබඳ වැටුප :————.

8. අදාල වෙනත් කරුණු :————.

මෙම අයදුම් පතෙහි මවිසින් සපයා ඇති කරුණු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. තවද, මෙහි අන්තර්ගත කරුණු අසත්‍ය බවට මා තෝරා ගැනීමට කලින් දැනගත හොත් මෙම තනතුර සඳහා මා නුසුදුස්සෙකු කිරීමට හැකි බවත් පත් කිරීමෙන් පසුව අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

————
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

7–253/2—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

## ලංකා ඛනිජ වැලි සංයුක්ත මණ්ඩලය

### ප්‍රධාන ගණකාධිකාරී තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා ලාංකික පුරවැසියන්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම්.**—(අ) ගණකාධිකරණය පිළිබඳව අවුරුදු 10 ක පළපුරුද්ද ඇති වරලත් ගණකාධිකාරවරයෙකු හෝ පිරිවැය හා කළමනාකාරිත්ව ගණකාධිකාරවරයෙකු හෝ විය යුතුය. මෙයින් අවුරුදු 5ක් ජ්‍යෙෂ්ඨ විධායක තනතුරක වීම අවශ්‍යය.

**වැටුප් ක්‍රමය.**—රු. 1,600—50—රු. 1,800. (සියළු දීමනා අඩංගු මාසික)

**සුදුසුකම්.**—(ආ) ගණකාධිකරණය පිළිබඳව අවුරුදු 10 ක පළපුරුද්ද ඇති වරලත් ගණකාධිකාරී වරයෙකු වීම සහ අවුරුදු 3ක් ජ්‍යෙෂ්ඨ විධායක තනතුරක් ඉසිලූ අයකුවීම.

**වැටුප් ක්‍රමය.**—රු. 1,200—50—රු. 1,400. (සියළු දීමනා අඩංගු මාසික).

වයස, සුදුසුකම්, පළපුරුද්ද හා සිංහල ප්‍රවීණතා මට්ටම් ආදිය සඳහන් කෙරෙමින් කොළඹ 10, ශ්‍රී විපුලසේන මාවතේ අංක 167හි, ලංකා ඛනිජ වැලි සංයුක්ත මණ්ඩලයේ ලේකම්/පිරිස් කළමනාකාර තැන වෙත 1973 ජූලි මස 31 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ අයදුම්පත් එවිය යුතුයි.

එස්. ඉලංගෝව,
ලේකම්/පිරිස් කළමනාකාර,
ලංකා ඛනිජ වැලි සංයුක්ත මණ්ඩලය.

167, ශ්‍රී විපුලසේන මාවත,
තැ. පෙ. 1212,
කොළඹ 10.

7–363—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

**ගැටමාන්න කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක තනතුර**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ තංගල්ල ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාශයේ පිහිටි ගැටමාන්න කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක තනතුර සඳහා අයදුම්පත් පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කර, 1973 අගෝස්තු මස 14 වැනි දින හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. මෙදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර භාරගනු නො ලැබේ.

බල ප්‍රදේශය :

1. අංක 483 — ගොඩවෙල ග්‍රාමසේවක කොට්ඨාශය
2. අංක 481 ඒ— අම්බල ග්‍රාමසේවක කොට්ඨාශය
3. අංක 481 — මහහීල්ල ග්‍රාමසේවක කොට්ඨාශය
4. අංක 476 — කුඩාහීල්ල ග්‍රාමසේවක කොට්ඨාශය
5. අංක 487 — ගැටමාන්න උතුර ග්‍රාමසේවක කොට්ඨාශය
6. අංක 487 ඒ—ගැටමාන්න දකුණ ග්‍රාමසේවක කොට්ඨාශය

2. මෙම තනතුර සඳහා ස්ථිර වැටුපක් ගෙවනු නොලැබේ. මරණ පරීක්ෂණ සඳහා එකකට රු. 10 ක් බැගින් ගෙවනු ලැබේ. මීට අමතරව ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව ගමන් වියදම් හා යැපීම් දීමනා ගෙවනු ලැබේ.

3. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක් ම—

(අ) ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 30 ට නොඅඩු බවට හෝ අවුරුදු 60 ට නොවැඩි බවට,

(ආ) විශිෂ්ඨ චරිතයෙන් හා මනා සෞඛ්‍යයෙන් යුක්ත බවට,

(ඇ) ඉහත සඳහන් බලප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු බවට, හා

(ඈ) 1925 සහ 1944 අතර කාලයෙහි ස්වභාෂා පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ සිංහල භාෂාව සහිත ඉංග්‍රීසි පාඨශාලා හැරයෑමේ සහතිකපත්‍ර විභාගය හෝ සිංහල භාෂාව සහිත අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඒ හා සමාන වූ ඊට උසස් විභාගයකින් සමර්ථ වී ඇති බවටත්, පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ ඉල්ලුම්පත්‍ර සමග පහත සඳහන් සහතිකවල පිටපත් ඉදිරිපත් කළ යුතුය :—

(අ) උප්පැන්න සහතිකය,

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතිකය,

(ඇ) චරිතය පිළිබඳව මෑතකදී ලබාගත් සහතික දෙකක් (ඉන් එකක් ග්‍රාමසේවකගෙන් විය යුතුයි),

(ඈ) ස්ථිර පදිංචිය සම්බන්ධයෙන් ග්‍රාම සේවකගේ සහතිකය.

5. මෙම ධුරය සඳහා රජයේ හා සංස්ථාවල සේවකයින්ගෙන් ද, පළාත් පාලන ආයතනවල සාමාජිකයින්ගෙන් ද අයදුම්පත් භාරගනු නොලැබේ.

6. ඉල්ලුම්පත් ලැබුණ බව දන්වනු නොලැබේ.

ඩී. එච්. ජේ. අබේගුණසේකර,
හම්බන්තොට දිස්ත්‍රික්කයේ දිසාපති.

1973 ජුලි මස 02 වැනි දින,
හම්බන්තොට දිසාපති කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත

**ගැටමාන්න කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක තනතුර**

1. (අ) අයදුම්කරුගේ සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.
   (ආ) අගට යෙදෙන නම :————.
   (ඇ) අනිකුත් නම් :————.
   (ඈ) ලිපිනය :————.
2. ස්ථිරව පදිංචි ස්ථානය හා එහි පදිංචි කාලය :————.
3. (අ) 1973. 08. 14 දිනට වයස :—
   අවුරුදු :——, මාස :——, දින :————.
   (ආ) උපන් දිනය හා ස්ථානය :————.
4. විවාහකද, අවිවාහකද යන වග :————.
5. අධ්‍යාපන සුදුසුකම් :————.
6. දැනට කරන රක්ෂාව :————.
7. ණයගැති වී තිබේද ? එසේ නම්, විස්තර :————.
8. තමා සතු දේපළවල ප්‍රමාණය හා වටිනාකම :————.
9. ඉල්ලුම්කරු කිසියම් චෝදනාවට වරදකරු වී අධිකරණයකින් දඬුවම් ලබා තිබේද ? එසේ නම්, විස්තර :————.
10. මෙම තනතුර සඳහා ලබා ඇති විශේෂ සුදුසුකම් ඇත්නම් ඒ පිළිබඳ විස්තර :————.

මෙහි සඳහන් කර ඇති යම්කිසි කරුණක් වැරදි හෝ අසත්‍ය බව හෝ පත්වීම ලැබීමට පෙර අනාවරණය වුවහොත් මගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමටද, පත්වීම ලැබුවාට පසුව අනාවරණය වුවහොත් කිසිම වන්දියක් නොගෙවා මා තනතුරින් පහකරනු ලැබීමටද යටත් විය යුතු බැව් දනිමි. මෙම අයදුම්පතේ දැක්වෙන සියලුම තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි.

————
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

7–390—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

අංකය : 1/23/35/7 (ජී).

**දෛනික වේතන ලබන අනියම් යතුරු ලේඛකයන්ට/ලේඛිකාවන්ට හා ලඝු ලේඛකයන්ට/ලේඛිකාවන්ට ස්ථිර තත්ත්වය පිරිනැමීමේ යෝග්‍යතා පරීක්ෂණය—ඔක්තෝබර් 1973**

**පරීක්ෂණ දිනය.**—1966. 3. 23 දින අංක 685 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ 5 වැනි ඡේදයේ හා 1969. 7. 7 වැනි දින අංක (ජී) 221 හා 1969. 7. 22 වැනි දින අංක (ජී) 223 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛ ලිපිවල සඳහන් දෛනික වේතන ලබන අනියම් යතුරු ලේඛකයින්ට/ලේඛිකාවන්ට හා අනියම් ලඝු ලේඛකයින්ට/ලේඛිකාවන්ට ස්ථිර තත්ත්වය පිරිනැමීමේ යෝග්‍යතා පරීක්ෂණය, විභාග කොමසාරිස් විසින් 1973 ඔක්තෝබර් 10 වැනි දින කොළඹ දී පවත්වනු ලැබේ.

2. **යෝග්‍යතාව.**—රජයේ දෙපාර්තමේන්තු විසින් නියමිත දෛනික වැටුප් ප්‍රමාණයක් මත අනියම් පදනමකින් මෙතෙක් සේවයෙහි නියුක්ත කොට ඇති යතුරු ලේඛකයෝ/ලේඛිකාවෝ හා ලඝු ලේඛකයෝ/ලේඛිකාවෝ පහත සඳහන් අවශ්‍යතාවන් සපුරාලන්නේ නම්, මෙම පරීක්ෂණයට පෙනී සිටීම සඳහා සුදුස්සෝ වෙති.

(1) **පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් තිබිය යුතුය :—**

(අ) 1968. 5. 29 වැනි දිනට පෙර බඳවා ගන්නා ලද අනියම් යතුරු ලේඛකයින්/ලේඛිකාවන් සහ ලඝු ලේඛකයින්/ලේඛිකාවන් ;

(i) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය, හෝ

(ii) (1) සිංහල/දෙමළ භාෂාව (2) අංක ගණිතය හෝ මූලික ගණිතය හෝ ශුද්ධ ගණිතය හෝ වාණිජ අංක ගණිතය සහ (3) වෙනත් විෂයයන් හතරකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය. මෙම විෂයයන් හයෙන් යටත් පිරිසෙයින් විෂයයන් පහකින්වත් එකම වාරයකදී සමත් වී සිටිය යුතුය.

(ආ) 1968. 5. 29 වැනි දිනට පසුව බඳවා ගන්නා ලද අනියම් යතුරු ලේඛකයින්/ලේඛිකාවන් සහ ලඝු ලේඛකයින්/ලේඛිකාවන් (සිංහල/දෙමළ මාධ්‍යයන්) ;

(i) භාෂාව ඇතුළු විෂයයන් හතරකට සම්මාන සාමාර්ථයන් සහිත ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය ; හෝ

(ii) (1) සිංහල/දෙමළ භාෂාව (2) අංක ගණිතය හෝ ශුද්ධ ගණිතය හෝ මූලික ගණිතය හෝ වාණිජ අංක ගණිතය සහ (3) වෙනත් විෂයයන් හතරක් සහිත අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය. මෙම විෂයයන් පහකින් එකම වාරයකදී සමත් වී සිටිය යුතු අතර සිංහල/දෙමළ භාෂාව ඇතුළුව යටත් පිරිසෙයින් විෂයයන් හතරකින්වත් සම්මාන සාමාර්ථයක් ලබා සිටිය යුතුය.

11. මෙම රෙගුලාසි වලින් විස්තර නොකරන ලද මීට අදාල වූ වෙනත් යම් කරුණක් වේ නම් එය රාජ්‍ය පරිපාලන අධ්‍යක්‍ෂ ජනරාල්ගේ අභිමතය පරිදි තීරණය කෙරෙනු ඇත.

පී. එච්. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන,පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් හා වැඩ බලන රාජ්‍ය පරිපාලන අධ්‍යක්‍ෂ ජනරාල්.

1973 ජූනි මස 30 වැනි දින,
කොළඹ 7,
රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුවේ දීය.

ආදර්ශ ඉල්ලුම් පත්‍රය.

| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි. |
| --- |

**දෛනික වේතන ලබන අනියම් යතුරු ලේඛකයන්ට/ලේඛිකාවන්ට හා ලඝු ලේඛකයන්ට/ලේඛිකාවන්ට ස්ථිර තත්ත්වය පිරිනැමීමේ යෝග්‍යතා පරීක්‍ෂණය—ඔක්තෝබර්, 1973**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින් ලියන්න) :————.
2. ස්ත්‍රී පුරුෂ භාවය :————.
3. තනතුර :————.
4. දෙපාර්තමේන්තුව :————.
5. කාර්යාලයීය ලිපිනය :————.
6. අනියම් ලඝු ලේඛක/යතුරු ලේඛක/ලේඛිකා තනතුරට පත් වූ දිනය :————.
7. ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් :————.

**සටහන.**—සම්මාන සාමාර්ථයන් ඒ ඒ විෂයයන් ඉදිරියෙන් දැක්විය යුතුය. (අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය නම් එම විභාගය පවත්වන ලද වර්ෂය හා මාසය, විභාග අංකය, එක් එක් අවස්ථාවේදී සමත් වූ විෂයයන් හා ලබා ඇති සම්මාන සාමාර්ථයන් ද සඳහන් කරන්න.)

8. අනියම් ලඝු ලේඛක/යතුරු ලේඛක/ලේඛිකා තනතුරට බඳවා ගන්නා ලද භාෂා මාධ්‍යය (එනම්: සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි) :————.

9. මුද්දර කොටුව :

| රු. 25.00 |
| --- |

**සටහන.**—අපේක්‍ෂකයන්/අපේක්ෂිකාවන් විසින් රු. 25 ක් වටිනා මුද්දර අලවා ඔහුගේ/ඇගේ අත්සන සහ දිනය යොදා ඒවා අවලංගු කළ යුතුය. මුද්දර එක පිට එක නො ඇලවිය යුතුය.

මා විසින් මෙහි අලවා ඇති මුද්දර මීට පෙර පාවිච්චි නොකරන ලද වලංගු ඒවා බවද, මා විසින් මෙහි කර ඇති ප්‍රකාශ මා දන්නා තරමින් ද, මගේ විශ්වාසයේ පරිදි ද, සැබෑ බවත්, නිරවද්‍ය බවත්, මාගේ ආත්ම ගෞරවයේ නාමයෙන් මම සහතික කරමි. මේ විභාගයේ ව්‍යවස්ථා පිළිපැදීමට මම එකඟවෙමි.

————,
අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත්සන.
(දෙපාර්තමේන්තු ප්‍රධානයා ඉදිරිපිටදී).

දිනය :————.

දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ සහතිකය

1. මේ අපේක්ෂකයා/අපේක්ෂිකාව මේ දෙපාර්තමේන්තුවෙහි සේවයෙහි නියුක්ත දෛනික වැටුප් ලබන අනියම් ලඝුලේඛකයෙකු/යතුරුලේඛකයෙකු/ලේඛිකාවක බවත්,

2. ඉහතින් දී ඇති තොරතුරු පරීක්ෂා කර බැලූ පසු නිවැරදි යයි පෙනී ගිය බවත්,

3. මෙතුවක් කල් ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදායකව පැවති බවත්,

4. නිලධාරියා/නිලධාරිනිය මෙම විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බව ද * රුපියල් 25 ක් වටිනා මුද්දර මෙම ඉල්ලුම් පත්‍රයට අලවා ඇති බව ද,

5. මේ පරීක්ෂණය හා සම්බන්ධ නීතිරීති අනුව ඔහු/ඇය මේ පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසු බවත්, මම සහතික කරමි.

* අදාල නොවන දෑ කපාහරින්න.

————,
අත්සන,
අත්සන් කරන නිලධාරියාගේ පදවිය,
(දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ පදවි නාමය ඉවනුවට).

දිනය :————.

**ලංකාවේ විභාග දෙපාර්තමේන්තුව**

විභාගාපේක්ෂකයන් සඳහා නීති

සියළුම විභාගාපේක්ෂකයන් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ :—

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් කිරීම ;

(ii) විභාගයේ එක් විෂයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සකු කිරීම ;

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම ;

(iv) මුළු ජීවිත කාලයේම විභාගයට පෙනී සිටීම තහනම් කිරීම ;

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම ;

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකියයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාග අපේක්ෂකයකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත්, රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

**නීති**

1. සියලුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසල දීත් විභාගශාලාධිපතීන්ට ද ඔහුගේ සහකාරයන්ට ද අනික් විභාගාපේක්ෂකයන්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්ත දාන්තව හැසිරිය යුතුයි. විභාග ශාලාවට ඇතුළුවන විටත් ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරුවිය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතීන්ගේ හා ඔවුන්ගේ සහකාරයන්ගේත් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීමට පටන් ගෙන පැය භාගයක් ගත වූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන්ගෙන පැය බාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටින අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටවී යාම ද තහනම් ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්‍ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයකුම තමාගේ විභාග අංකය දරණ ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුයි. විභාග ශාලාධිපතීන්ගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නො කරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළතදී විභාග කාර්ය මණ්ඩලයේ කෙනකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ ඉන් පිටත හෝ සිටින කිසිවකු සමග මොනම කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම්කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවකු සමග කතාබස් කිරීම ආදියත් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතීන්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයකුගේ උත්තර පත්‍රය අඳුනා ගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමනක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතු කොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කෑබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැට ගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ සියතින්ම බාර දිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිව යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකුසේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙන යම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාගශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ කථා කිරීම අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

ශෝගොඩ ප්‍රේමරත්න,
විභාග කොමසාරිස්.

කොළඹ 2, මැලේ වීදියේ,
විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

7-361—73.07.13 වැනි දින අංක 68 දරන ගැසට් පත්‍රය

---

## 1973 අප්‍රේල් මස පවත්වන ලද නොතාරිස් අවසාන විභාගය

මෙහි පහත නම් සඳහන් අයදුම්කරුවන් ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් පෙන්නුම් කරන භාෂාවෙන් නොතාරිස් වෘත්තියේ කටයුතු කිරීම සඳහා නොතාරිස් අවසාන විභාගයෙන් සමත් වී සිටින බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

| නම | කටයුතු කරන භාෂා මාධ්‍යය |
|---|---|
| (1) ආර්. ඒ. පියදාස ... | ... සිංහල |
| (2) ඩබ්. ඒ. අමරසූරිය ... | ... සිංහල |
| (3) ඩී. ඒ. සිරිසේන ... | ... සිංහල |
| (4) එස්. පී. ජයසිංහ මිය ... | ... සිංහල |
| (5) ඩී. ඊ. එන්. අබේසිංහ | ... සිංහල |
| (6) එස්. ඩබ්. ඩබ්. අප්පුහාමි | ... සිංහල |
| (7) ඈන්. බී. කේ. චන්ද්‍රසීලි මිය. | ... සිංහල |
| (8) එස්. එම්. සී. බී. සෙනෙවිරත්න | ... සිංහල |
| (9) එස්. ඒ. පී. සමරසුන්දර | ... සිංහල |
| (10) එච්. එම්. ඩබ්. බණ්ඩාර | ... සිංහල |
| (11) ජී. එස්. ධම්තිලක ... | ... සිංහල |
| (12) ඩබ්. එල්. බී. සෙනෙවිරත්න | ... සිංහල |
| (13) ජේ. පී. පතිරණ ... | ... සිංහල |
| (14) ආර්. ඇම්. ආර්. ඒ. පී. කරුණාතිලක | ... සිංහල |
| (15) කේ. එච්. එස්. වික්‍රමරත්න | ... සිංහල |
| (16) පී. වික්‍රමගේ ... | ... සිංහල |
| (17) එජ්. ජී. ඩබ්. ගොඩකුඹුර | ... සිංහල |
| (18) ජී. ප්‍රෙමරත්න ... | ... සිංහල |
| (19) එච්. එස්. කුරුණාරත්න | ... සිංහල |
| (20) එස්. ලියනගමගේ ... | ... සිංහල |
| (21) එම්. එස්. එම්. මුහුෂින් | ... සිංහල |
| (22) ආර්. සූරිආරච්චි ... | ... සිංහල |
| (23) පී. බියන්විල ... | ... සිංහල |
| (24) පී. ජී. සී. ඩයස් ... | ... සිංහල |
| (25) කේ. බී. කරුණාතිලක | ... සිංහල |
| (26) එම්. කේ. එස්. පී. කුමාරරත්න | ... සිංහල |
| (27) බී. එල්. ජී. ගුණවන්ත | ... සිංහල |
| (28) ඩී. ඩී. එස්. සිරිපාල ... | ... සිංහල |
| (29) ඊ. ජයසූරිය ... | ... සිංහල |
| (30) කේ. එච්. එල්. එල්. ප්‍රනාන්දු | ... සිංහල |
| (31) එම්. ඩී. පියසේන ... | ... සිංහල |
| (32) යූ. රත්නාවතී මිය. ... | ... සිංහල |

හමීඩ් fපාරුක්,
රෙජිස්ට්රාර් ජනරල්.

1973 ජූනි 20 වෙනි දින,
රෙජිස්ට්‍රාර් ජනරාල් කායාීලය,
කොළඹ.

7-170—73.07.13 වැනි දින අංක 68 දරන ගැසට් පත්‍රය

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

**සැ.යු.**—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

## උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|
| ජූලි | 73.07.06 | සිකුරාද | ... | 73.06.27 | බදද | දවල් | 12.00 |
| | 73.07.13 | සිකුරාද | ... | 73.07.04 | බදද | දවල් | 12.00 |
| | 73.07.20 | සිකුරාද | ... | 73.07.11 | බදද | දවල් | 12.00 |
| | 73.07.27 | සිකුරාද | ... | 73.07.18 | බදද | දවල් | 12.00 |
| අගෝස්තු | 73.08.03 | සිකුරාද | ... | 73.07.25 | බදද | දවල් | 12.00 |
| | 73.08.10 | සිකුරාද | ... | 73.08.01 | බදද | දවල් | 12.00 |
| | 73.08.17 | සිකුරාද | ... | 73.08.08 | බදද | දවල් | 12.00 |
| | 73.08.24 | සිකුරාද | ... | 73.08.15 | බදද | දවල් | 12.00 |
| | 73.08.31 | සිකුරාද | ... | 73.08.22 | බදද | දවල් | 12.00 |
| සැප්තැම්බර් | 73.09.07 | සිකුරාද | ... | 73.08.29 | බදද | දවල් | 12.00 |
| | 73.09.14 | සිකුරාද | ... | 73.09.05 | බදද | දවල් | 12.00 |
| | 73.09.21 | සිකුරාද | ... | 73.09.11 | බදද | දවල් | 12.00 |
| | 73.09.28 | සිකුරාද | ... | 73.09.19 | බදද | දවල් | 12.00 |

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

**1972 ඔක්තෝබර් 20 වැනි දින.**
**ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**කොළඹ.**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.